An Interllctual Discourse on

# Will Aesthetic Education in Sri lankan Universities Collapse in Future?

# ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපනය බිඳවැටෙයිද?

## විද්වත් කතිකාව

**2011 ජුනි මස 8 වන දින සවස 2:30 සිට 6:30 දක්වා**

**කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේදි**

**ශ්‍රී පාලි මණ්ඩපය සුරැකීමේ සංවිධානය විසින් පවත්වන ලදි.**

කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රීපාලි මණ්ඩපයෙහි ජනමාධ්‍ය අධ්‍යයනාංශය සහ ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය යනුවෙන් ප්‍රධාන දෙපාර්තමේන්තු දෙකක් ඇති අතර ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රයට සම්බන්ධිතව සිදුකෙරුණු විද්වත් සාකච්ඡාවෙහි සංස්කරණ සහිත ප්‍රකාශනය.


**සංස්කරණය**

**ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රංජන්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ජනමාධ්‍ය අධ්‍යයනාංශය**

**ප්‍රියන්ත ෆොන්සේකා**
**කථිකාචාර්ය**
**ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය**

**තුමිඳු දොඩන්තැන්න**
**කථිකාචාර්ය**
**ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය**



**ප්‍රකාශනය**
**පර්යේෂණ සහ ප්‍රකාශන ඒකකය**
**ශ්‍රීපාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල සෞන්දර්ය අධ්‍යාපනය බිඳවැටෙයිද? යන තේමාව යටතේ සහභාගී වූ විද්වතුන්

සාකච්ඡාව මෙහෙයවීම

**ප්‍රියන්ත ෆොන්සේකා**

**ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා**
**මණ්ඩපාධිපති, ශ්‍රීපාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

**ආචාර්ය ලියනගේ අමරකීර්ති**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**පේරාදෙනිය විශ්වවිද්‍යාලය**

**ආචාර්ය මයිකල් ප්‍රනාන්දු මහතා**
**හිටපු අංශාධිපති, ලලිත කලා අධ්‍යයන අංශය,**
**පේරාදෙනිය විශ්වවිද්‍යාලය**

**ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන**
**බාහිර කථිකාචාර්ය**
**ශ්‍රී පාලි මණ්ඩපය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

**ආචාර්ය ප්‍රභාත් ජයසිංහ,**
**විශ්වවිද්‍යාල ආචාර්ය සංගමයේ ගරු උප ලේකම්,**
**කොළඹ විශ්වවිද්‍යාලය**

**චන්ද්‍රගුප්ත තේනුවර මහතා,**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

**සඳරුවන් තිලකරත්න මහතා, ශිෂ්‍ය,**
**මාධ්‍ය ප්‍රකාශක,**
ශ්‍රීපාලි මණ්ඩපය සුරැකීමේ ව්‍යාපාරය

# පූර්විකාවයි

කොළඹ විශ්වවිද්‍යාලයීය හොරණ ශ්‍රීපාලි මණ්ඩපය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට (University of Visual and Performing Arts) අනුබද්ධ කිරීමේ යෝජනාවට එරෙහිව ගොඩනැගුනු මතවාදයේ ප්‍රමුඛතම සාකච්ඡාවක් ලෙස 2011 ජූනි මස 08 වන දින “ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපනය බිඳ වැටෙයිද?” යන තේමාව යටතේ කෙළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේදී පැවැත් වූ විද්වත් සාකච්ඡාව සැලකිය හැකිය.

එම විද්වත් කතිකාව පිළිබඳ ශ්‍රී ලංකාවේ සෑම විශ්වවිද්‍යාලයකම අදාළ දෙපාර්තුමේන්තු දැනුවත් කළ අතර එම විශ්වවිද්‍යාල ආචාර්යවරු, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්, දෙමව්පියන් සහ වැඩිහිටි යන සිව්වනක් පිරිසගේ සහභාගිත්වය එහි සාර්ථකත්වය සඳහා හේතු විය. එම විද්වත් සාකච්ඡාවේ සියලු තොරතුරු ලේඛන ගත කරමින් ඔබට මෙලෙසින් ලබා දීමට අප අදහස් කළෙමු.

කොළඹ විශ්වවිද්‍යාලයීය හොරණ ශ්‍රීපාලි මණ්ඩපයෙහි ජනමාධ්‍ය අධ්‍යනාංශය සහ ප්‍රාසාංගික කලා අධ්‍යනාංශය යනුවෙන් ප්‍රධාන දෙපාර්ත්මේන්තු දෙකක් ඇති අතර එය පීඨ දෙකක් දක්වා වර්ධනය වෙමින් පවතී. ජනමාධ්‍ය සහ ප්‍රාසාංගික කලාව පිළිබඳ විශේෂ උපාධි පිරිනමන ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විශ්වවිද්‍යාල මණ්ඩපයක් ලෙස මෙය හඳුනාගෙන ඇත.

ශ්‍රීපාලි මණ්ඩපයෙහි දර්ශනය වනුයේ,

> බුද්ධිමය දායකත්වය, විවෘත භාවය, උනන්දු කරවීම, වෘත්තියවේදී බව, ප්‍රියජනක සහ සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීම, සහයෝගිත්වයෙන් යුත් සංවර්ධනය අරමුණු කර ගත් පුළුල් වූ සහභාගිත්වයක් ඇති කිරීම යනුවෙනි.

මෙම දර්ශනය මුලිකාංගව ගොඩනැගුණු මෙම ප්‍රධනතම විෂය ක්ෂේත්‍ර දෙක ශ්‍රී ලංකාවේ තත්ත්ව සංරක්ෂණ ක්‍රමවේදය උපයෝගී කොට ගත් සාම්ප්‍රදායික ගුරු කුලයෙන් (Traditional Thought of School) බැහැරව නව ලිබරල් ක්‍රමවේදයනට කේන්ද්‍රීය වූ නූතන චින්තන මාධ්‍ය ගුරු කුලයක් ලෙස (Modern Thought of

Media School) ශාස්ත්‍රාලයීව පර්යේෂණයන්ට නැඹුරු වෙමින් ඉතා වේගයෙන් ප්‍රවර්ධනය වෙමින් පවතී.

කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රීපාලි මණ්ඩපයෙහි ජනමාධ්‍ය පීඨය සෞන්දර්ය තුළ වුව නිර්මාණය වන මාධ්‍යමය (Medium) ශක්‍යතාව පිළිබඳ පුලුල් නිපුනතාවන්ගෙන් යුක්තව මතවාදී සහ තාර්කික ලෙසින් විවරණය කරනු ලබයි. ජනමාධ්‍ය මූලිකව සෞන්දර්ය කලාවන් අනෙකුත් සාමාජීය විද්‍යාවන්ගේ  සහ ස්වභාවික විද්‍යාවන්ගේ ද දැනුම සහ ක්‍රමවේද විද්‍යාත්මකව යොදා ගනිමින් නිදහස් ආකෘතියකින් ශාස්ත්‍රාලයීය සේවාවන් ගෙන දෙමින් සිටි. ඒ අනුව සෞන්දර්ය සම්ප්‍රදායන් දිගු මානව ඉතිහාසයක මානව සංරචකයන් සමඟ ව්‍යුහගත වුවත් පශ්චාත් නූතන යුගයේ ක්‍රමවේදාත්මක ප්‍රවේශයකට අනුගතව කලාවෙහි මාධ්‍යමය කාර්යභාරය හා හේතුඵල සබඳතාව විශ්ලේෂණය කරමින් සෞන්දර්ය පිළිබඳ දෘෂ්ටි වර්ධනයට හොරණ ශ්‍රීපාලි විශ්වවිද්‍යාල මණ්ඩපය තිරණාත්මකව බලපෑමක් කරමින් සිටී. සෞන්දර්යයේ තාර්කික සහ දාර්ශනික පදනම ජනමාධ්‍ය තුළින් ජාතික සංවර්ධන අරමුණු මූලික කර ගනිමින් ව්‍යාඛ්‍යාන කරමින් සිටී. ජාතික හා සමාජ අවශ්‍යතා කේන්ද්‍රීයව ශිල්පාත්මක ලෙස ගොඩනැගුණ ජනමාධ්‍ය පාඨමාලාව බහු විෂයීය ක්‍රමවේද හා න්‍යායන් තුළ නිරුක්තින් සම්පාදනය කරමින් පර්යේෂණ දිශානතියට විවරව උප විෂය රාශියකට අනුගත වූ ප්‍රායෝගික භාවිතය තුළ ශික්ෂණය වූ සමාජ උරුමයකි.

සියලු විද්‍යාවන්හි ඓතිහාසික සාධක පිළිබඳ විවරණය කිරීමේදී ඒවාහි සියලු මත සහ සම්ප්‍රදායන් විවිධත්ව පදනම මත ගොඩනැගී ඇති බැව් පැහැදිලිය. සියලු සමාජ සම්ප්‍රදායන් සහ සමාජ බණ්ඩයන් “ඒකීය ලෝක විඥානයකට” කේන්ද්‍ර කළ නොහැකි අතර එය අදාළ විෂයන්හි  ව්‍යුහාත්මක වෙනසකට මෙන්ම තාර්කික වර්ධනයටද සහේතුක වී තිබේ. සියලු කලාවන්, ව්‍යුහයන් සහ සංස්කෘතික වටිනාකම් වර්ධනය වීමට ඉඩ තිබිය යුතුවේ. ජනමාධ්‍ය පුද්ගල චින්තන සහ සංවර්ධන ශක්‍යතා පුළුල් කරන අතර කලා සෞන්දර්යන් එම ප්‍රවේශයන්හි හැඩතල නිර්මාණය කරමින් විදින සමාජයක හිමිකාරත්වය ගොඩ නංවයි. එමෙන්ම මනුෂ්‍යත්වය හා මානව සබදතාවන් ගොඩ නැංවීමේදී සෞන්දර්ය ප්‍රමුඛ සාධකය බවට පත්වේ.

ඒ අනුව ඒකීය සෞන්දර්යක් හෝ සියලු කලා සෞන්දර්ය සඳහා ප්‍රමිති සම්පාදනය කරන ඒකීය ආයතනයක් ගොඩනැගිය හැකිද යනු ප්‍රබල ගැටලුවකි. ඒ පිළිබඳව ගොඩනැගුණු විද්වත් සාකච්ඡාවේ අන්තර්ගතයන් සංස්කරණ සහිතව මෙහි ඉදිරිපත් කරනු ඇත.

ශ්‍රීපාලි විශ්වවිද්‍යාල මණ්ඩපයෙහි නූතන සහ පශ්චාත් නූතන සම්ප්‍රදායන් හා මතවාද ගුරු කොට ගත් මෙම නව සමාජ උරුමය මරා දැමීමට කටයුතු කිරීම ජාතිකමය වශයෙන් ගොඩ නැගෙන ප්‍රබලතම අපරාධයකි.

# කලා සෞන්දර්ය සංවර්ධනය සඳහා විවිධත්වය සහ ශ්‍රී පාලි කලා විෂයෙහි අනන්‍යතාව

ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා

අද අපේ රටේ පොදුවේ පශ්චාත් යුද ලාංකිය සමාජය තුළ පවතින මතවාදි, සදාචාරාත්මක, හා දේශපාලන අර්බුදය මධ්‍යයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් ගැඹුරු වෙනස්කම් සිදුවෙමින් පවතින යුගයක අපි ජිවත් වන්නෙමු. සිදුවන දේවල් පිළිබඳව රටේ ජනතාව තුළ ඇත්තේ අවිනිශ්චිතතාවකි. විවිධාකාරවූ මතිමතාන්තර පළවෙමින් පවතිනවා. මෙම සාකච්ජාව මුලික වශයෙන් අපි යොදා ගන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ඒකාබද්ධ කිරිමේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනට පවතින අදහස් සම්බන්ධයෙන් අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කිරිම සඳහාය. මෙකි හමුවිමේ ප්‍රධානතම වැදගත්කම ඔස්සේ ගමන් කරන විට අපේ ප්‍රධාන මාතෘකාව බිහි වන්නේ විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපනය බිඳ වැටේද? මෙකී දෙක අතර තිබෙන සම්බන්ධය කුමක්ද? යන කරුණුය. අපි හිතන ආකාරයට යම්කිසි ශාස්ත්‍රාලිය සම්ප්‍රාදායන්, ප්‍රවණතාවන් ලෝකයේ දියුණු වන්නේ සංවර්ධනය වන්නේ එකිනෙකට පරස්පර සමහර විට එකිනෙක ට සමගාමී එකිනෙකට ප්‍රතිවිරුද්ධ සංකිර්ණ සංදර්භයක් අනුවය. නමුත් පොදුවේ පිළිගන්නාවු මේ අදහසට එරෙහිව යමින් ලංකාව තුළ මෑතක පවතින අදහස් ලෙස මේ ඒකීය සෞන්දර්ය, මෙය ඉතාමත් අනතුරුදායක මෙන්ම මෙය විෂය අතින්ද ඒ වගේම සෞන්දර්ය නැතහොත් ප්‍රසංගික කලා ක්ෂේත්‍රයේ නියැලි සිටින විද්‍යාර්ථීන්, විද්වතුන් ඔවුන්ගේ පැත්තෙනුත් ඔවුන්ගේ මතයට, ඔවුන්ගේ ආකල්පයනට ගරු නොකරන තත්ත්වයක් ලෙසයි.

අපි දැඩි ලෙස විශ්වාස කරන ආකාරයට සෞන්දර්ය විතරක් නොව ඕනෑම විෂයක් දියුණු වන්නේ සංවර්ධනය වන්නේ යම් යම් එකිනෙකට පරස්පර විවිධ ගුරුකුල විවිධ ප්‍රවණතාවන් ඔස්සේය. නමුත් මේ සියල්ලම එක තැනකට එක්තැන් කිරිම තුළ එවැනි වටපිටාවකට තිබෙන පරිසරය නැතහොත් එකී කොන්දේසිය ඇහිරෙනු ලැබෙනවා. ඒ අනුව මේ ඒකාබද්ධ කිරීම තුළ සෞන්දර්ය විශ්වවිද්‍යාලයටත් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයටත් සිදුවනු ලබන සෙතක් නොවේ. විශේෂයෙන්ම ශාස්ත්‍රාලිය පැත්තෙන් බලන කල විශ්වවිද්‍යාලයක් යන්න විශාල ගොඩනැගිලි ඉඩම් හෝ ශිෂ්‍ය සංඛ්‍යාව නොවේ. විශ්වවිද්‍යාලයක

ප්‍රධානම දේ තමයි ශාස්ත්‍රාලීය විෂය, ශාස්ත්‍රාලීය සම්ප්‍රදාය නැතිනම් දැනුම නිෂ්පාදනය කිරීම. ශිෂ්‍යයන් එක්කෙනෙකුන්වත් නැතිවත් මේ දැනුම නිෂ්පාදනය කිරීමට පුළුවන්. ගොඩනැගිලි එකක්වත් නැතුවත් කෙරෙන්න පුළුවන්. ලොව බිහිවෙලත් තිබෙනවා. මෙය ඉතා ගැඹුරින් තේරුම්ගත යුතු කාරණයක්. කාට හෝ මෙය උඩින් පේන්න පුළුවන් ඇයි මේ මෙතැනත් සෞන්දර්ය එතනත් සෞන්දර්ය මේවා එකතැනකට එකතු කළහම කොච්චර හොඳද? කියන එක. ඇත්තම මෙය සරල සමීකරණයක්. උඩින් බලන කාටත් පේන්න පුළුවන් ඒ විදිහට. නමුත් මෙය ඉතා සංකීර්ණ ගැටලුවක්. මේවා එකට එකතු කිරීම තුළ මේවා එකතු කිරීමෙන් ලැබෙන වාසියට ප්‍රයෝජනයට වඩා ඇතිවන හානිය එකී ප්‍රතිවිපාකය තුළ සමහරවිට මෙය විනාශවී යන්නද පුළුවන්. මෙන්න මේ නිසා මෙකී ස්ථාවරයේ හිඳගෙන තමයි අපි කියන්නේ අනාගත ලංකාවේ සෞන්දර්ය අධ්‍යාපනය යම්කිසි අර්බුදයට යන්න පුළුවන් යන වග.

එකක් තමයි දැනට ලංකාවේ තියෙන සෞන්දර්ය අධ්‍යාපනයේ තිබෙන ප්‍රධාන ප්‍රවණතාව තමයි තත්ත්වසංරක්ෂණවාදය. එය හරියටම ලංකාවේ පවතින සාම්ප්‍රදායික ගුරුකුල, ගුරුන්නාන්සේලාගේ තිබෙන කලායතන, කලා සංවිධාන දිගටම කරගෙන යෑමක් තමයි. නමුත් සමකාලීන ජාතික සහ ගෝලීය තත්වයන් ඉල්ලා සිටින සෞන්දර්ය, ප්‍රාසංගික කලාව ඊට වඩා සංකීර්ණ, ගතික සහ නවීකාරක ප්‍රවණතාවක් ඉල්ලා සිටින්නකි. එම සෞන්දර්යාත්මක, ප්‍රාසංගික වටිනාකම් හා වින්දනය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සහ නවීන දැනුම, කුසලතා හැඩගැස්වීම වර්තමාන සෞන්දර්ය කලා කර්මාන්තයේ මූලික අභියෝගයකි. එම අද්‍යතන ජාතික සහ ගෝලීය තත්වයන් මඟින් ඉදිරිපත් කරන අභියෝගය සාර්ථකව ජය ගැනීම සඳහා අවශ්‍ය වන අධ්‍යයන පාඨමාලාවක් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය සතුව පවතින බව කිව යුතුය. අද ශ්‍රී ලංකාවේ ප්‍රාසාංගික කලාව සහ සෞන්දර්ය කලා භාවිතයන් සාම්ප්‍රදායික රාමුවෙන් එහාට ගොස් නැති අතර ශාස්ත්‍රාලීය, සංකල්පීය සහ න්‍යායික සෞන්දර්යවේදය සහ ප්‍රාසංගිකවේදය ලෝක ප්‍රවණතා මට්ටමට ළඟා වී නැත. මම අභියෝග කරනවා ලංකාවේ සෞන්දර්ය දැන් වසර ගණනාවක් තිබුනා. මේ සෞන්දර්ය අධ්‍යාපනය තුළ යුරෝපයේ මට්ටමට තැබිය හැකි එක පර්යේෂණාත්මක නිබන්ධනයක් දැනට බිහිවෙලා තිබෙනවාද? නව දැනුම

සම්පාදනය කරමින් සෞන්දර්ය කියන එක ආදාළ යුගයේ දාර්ශනික සම්ප්‍රදායේ කොටසක් ලෙස දියුණු වෙලා තිබුණා.

ලෝක ඉතිහාසයේ පැරණි ග්‍රීසිය අරන් බැලුවහොත් ග්‍රීක දර්ශනයෙන් වෙන් කරන්නට බැහැ සෞන්දර්ය. මධ්‍යතන යුගය අරන් බැලුවහොත් දේවධර්මවාදයෙන් වෙන් කරන්නට බැහැ සෞන්දර්ය. පුනරුද යුගය අරන් බැලුවහොත් පුනරුද යුගයේ විද්‍යා ප්‍රබෝදයෙන් වෙන් කරන්නට බැහැ සෞන්දර්ය. නූතනවාදි දර්ශනයෙන් වෙන් කරන්න බැහැ ඉදිරියටත් එහෙම තමයි.

නමුත් අපේ රටේ මේ සෞන්දර්ය බොහොම පවුල් කේන්ද්‍රිය, කුල කේන්ද්‍රිය ඒ වගේම බොහොම පටු තැනක තමයි මේක තියෙන්නේ. ඉතාමත් වැඩවසම්වාදි සාම්ප්‍රදායක් මේක ඇතුළේ තියෙන්නේ. ආචාරධර්ම විදිහටත්, ශාස්ත්‍රාලිය විදිහටත්, ආයතනික විදිහටත්. මේකට අපේ මණ්ඩපය ආරම්භ කිරීමට පෙර ද, මීට දශකයකට විතර පෙර අපි පුළුල් අධ්‍යනයක් කලා මේ රටේ. ඒ අධ්‍යනයෙන් හෙළි වෙච්ච තොරතුරු තමයි. සමකාලින ග්‍රාහකයින්ගේ, ජනතාවගේ, පාරිභෝගිකයින්ගේ සෞන්දර්ය හා කලාත්මක අවශ්‍යතාවන් වලට ගැළපෙන ආකාරයේ සෞන්දර්ය නිෂ්පාදනයක් මේ සෞන්දර්ය කර්මාන්තය තුළ සිදුවෙන්නේ නැතැයි කියන එක. ඒක අතිශයින්ම කල්පනා කරන්න ඕන ප්‍රශ්නයක් ඇත්ත වශයෙන්ම. එම නිසා වචනයේ පුළුල් අර්ථයෙන්ම ගතහොත් තවමත් අපේ රටේ සෞන්දර්ය අධ්‍යාපනයක් තිබෙනවාද? කියන එක ප්‍රශ්නයක්. බිඳවැටිම කෙසේ වෙතත්. මෙය ඉතාමත් සංකිර්ණ ගැටලුවක්. තියෙන්නේ වැඩවසම්වාදි, ශ්‍රෝත්‍රවාදි, කුලවාදි, පුද්ගලවාදි, ආයාසයන් හා උත්සාහයන්. මෙන්න මේ නිසයි අපට අවශ්‍ය වන්නේ විද්‍යාත්මක ප්‍රවේශයක් මේ සම්බන්ධයෙන්. එහි පදනම විය යුත්තේ එය දෛනික පාරිභාරික ජිවිතයට සම්බන්ධව වර්ධනය කිරීමයි. මෙහි දී අපේ කතාව වනුයේ ප්‍රසාංගික කලාව කියන්නේ ඉදිරිපත් කිරීමේ කලාවයි. සෞන්දර්ය විෂය ධාරාවේ එක කොටසක් ලෙස තමයි ඉදිරිපත් වන්නේ, මේ ප්‍රසංගික කලාව. එය ගැටලු සමඟ වර්ධනයවනවා. දෛනික ජිවිතයට සම්බන්ධව එය වර්ධනයවනවා. සමකාලින තාක්ෂණය සමඟ එය වර්ධනයවනවා. මිනිසුන්ගේ චර්යා රටාවන් එක්ක එය වර්ධනය වෙනවා. නමුත් අපේ ලංකාවේ ඉතිහාසයේ සෞන්දර්ය ඉතිහාසයක් නැහැ, මෙසේ වර්ධනය වෙච්ච. ඇත්තෙන්ම මෙය ලොකු ගැටලුවක්. මෙකි ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තින්දු තිරණ ගන්නා අයටත් ලංකාවේ

සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පද්ධතිවල ඉන්න සමහර ආචාර්ය, මහාචාර්යවරුන්ටත් තේරෙන්නේ නැති දෙයක්. නමුත් මෙය තේරෙන සුළු පිරිසකුත් ඉන්නවා.

නමුත් ඒ අයගේ අදහස් එළියට එන්න විදිහක් නැහැ. එක සෞන්දර්ය විශ්වවිද්‍යාලයෙත් ඉන්නවා හැම විශ්වවිද්‍යාලයකම ඉන්නවා. නමුත් අධිපතිවාදි චින්තනය, අධිපතිවාදි මතවාදය තුළ මේ සම්ප්‍රදාය තුළ මේ ජාතිවාදය තුළ හිරවෙලා ඉන්නේ. මේ ගොල්ලන්ට එළියට එන්න විදිහක් නැහැ. ශ්‍රීපාලි මණ්ඩපය තුළ එක දෙයක් තමයි අපේ තත්ත්වසංරක්ෂණවාදය එරෙහිව විකල්පිය, විද්‍යාත්මක, නව්කාරක ප්‍රවණතාවක් ඔස්සේ සමකාලින ජාතික හා ගෝලිය වශයෙන් නිෂ්පාදනය වන හා සොයා ගන්නා සෞන්දර්ය ක්ෂෙත්‍රය හා ප්‍රසංගික කලා ක්ෂෙත්‍රයේ විශේෂයෙන්ම, ජනමාධ්‍ය ක්ෂෙත්‍රයේ දැනුම ඒ ශිල්පීය ක්‍රමයන් අපේ මේ නව පරම්පරාවට ලබා දිලා ගෝලිය වශයෙන් අවශ්‍ය කරන සෞන්දර්ය හා මාධ්‍ය ප්‍රවේශයක් සම්පාදනය කිරිම. මෙන්න මෙක තමයි අපේ ආයාශය.

පසුගිය දශකය තුළ විශිෂ්ට ප්‍රතිඵල මෙයින් උදාවෙලා තියෙනවා. අපේ ප්‍රසංගික පාඨමාලාව, ජනමාධ්‍ය පාඨමාලාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන තත්ත්ව පාලන කමිටුවේ විශාල විදිහට ඇගයිමට ලක් වි තිබෙනවා. අපි මෙහිදි ජනමාධ්‍ය පාඨමාලාව ගැන කතා කරන්නේ නැහැ. ප්‍රසංගික පාඨමාලාව අධ්‍යාපන කේෂ්ත්‍රයේ මාධ්‍ය කේෂ්ත්‍රයේ ප්‍රසංගික කර්මාන්ත කේෂ්ත්‍රයේ අපේ අය විශාල ලෙස එම ක්ෂෙත්‍රවල, කටයුතු කරමින් සිටිනවා.

නමුත් කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය යන ආයතන දෙක එකට එකතු කිරීම තුළින් න්‍යායිකවත්, ප්‍රායෝගිකවත් අප රටට සහ මෙම විෂයට සිදුවන සෙතක් නැත. මේ ස්වාධින අනන්‍යතා දෙකක් සහිත ආයතන දෙක වෙන වෙනම පැවැතිම අප රටට ඉතාම අවශ්‍ය වේ. මේ දෙකම අවශ්‍යයයි, හැබැයි ප්‍රශ්නය තියෙන්නේ දෙක එකතු කිරිම පිළිබඳ ගැටලුව. තත්ත්වසංරක්ෂණවාදය හා සාම්ප්‍රදායික සෞන්දර්ය කලා උරුමය අවශ්‍යයයි. අපේ කලා උරුමය සෞන්දර්ය උරුමය මේක පවත්වාගෙන යාම අවශ්‍යයයි. ඒක ඕනැම රටක සිදුවන දෙයක්. ඒවගේම ඒවා පාදක කරගෙන ඒවා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොකර බොහෝම විචාරාත්මකව, විමර්ශනශිලිව නව තත්ත්වයනට ගළප්පමින් අලුත් තත්ත්වයනට ගැළපෙන ආකාරයේ ප්‍රසංගික හා සෞන්දර්ය ප්‍රවේශයක් දියුණු කිරිමත් අවශ්‍යයයි. ඔය දෙවෙනි

කාරණයට තමයි අපි අතගහලා තියෙන්නේ. එතකොට මේ දෙක එකතු කිරීම තුළ තමයි තියෙන්නේ ගැටලුව. මේ දෙකෙන් එකක් නැතිවෙලා යන්න පුළුවන්. එහෙමත් නැත්නම් දෙකම නැතිවෙලා යන්න පුළුවන්. මොකද එකින් එක පරස්පර පද්ධති සාමාන්‍ය භෞතික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් තියෙන අයට තේරෙනවා එකට එකතු වුනාම මොකද වෙන්නේ කියලා. එහෙම නැතිනම් ප්‍රබල පද්ධතිය විසින් දුබල පද්ධතිය විනාශ කර ගන්නවා. නැතිනම් දෙකම කවලම් වෙච්ච අනවශ්‍ය දෙයක් බිහි වෙන්න පුළුවන්. අන්න එහෙම තමයි ගැටලු සිදුවනුයේ.

ඉතින් මෙන්න මේ තත්ත්වය මේ ප්‍රධාන පරමාර්ථය ඇත්ත වශයෙන්ම අපේ මේ තීන්දු තීරණ ගන්න අපේ දේශපාලන පර්ශද වලට, අපේ තීන්දු තීරණ ගන්න වෙනත් පර්ශද වලට යම්කිසි ආකාරයක වැටහිමක් ලබා දෙන්න. මේ එකතු කිරීම සරල කාරණයක් නොවන වග යන්න. මේක බොහොම ගැඹුරින් හිතන්න ඕන. විශේෂයෙන්ම මේ ගැන යම්කිසි ආකාරයක පර්යේෂණයක් කරලා හෝ අධ්‍යයනයක් කරල නැහැ. මේක එකතු කරන්නේ කියන එක, එකතු කළොත් මොකද වෙන්නේ කියන එක. මෙන්න මෙතන ලොකු ගැටලුවක් තියෙනවා. ඒ නිසා තමයි අපිට දැනට තියෙන තොරතුරු, දැනට තියෙන දැනුමත්, එක්ක අපිට මොනම විදිහෙන්වත් මේ කාරණාවත් එක්ක එකඟ වෙන්න බැරි.

මේ විද්වත් කතිකාවේ අපේ ප්‍රධාන අරමුණ කේන්ද්‍ර වෙන්නේ මේ බෙහොම සියුම් තැනක් සමඟයි. සමහරවිට මේක මහජනතාවට බොහෝ විට සංවේදි වෙන කාරණාවක් නොවන්නට පුළුවන්. මේක මේ වෘත්තිය සමිති අරගලයක් හෝ දේශපාලන බලය අල්ල ගන්න කරන අරගලයක් හෝ එම නොවන වෙන එහෙම දෙයක් නෙමෙයි. අප මේ ශාස්ත්‍රිය කාරණයක් වෙනුවෙන් පෙනී සිටින්නේ. ලංකාවේ මම හිතන්නේ විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රථම වතාවට සෞන්දර්ය පිළිබඳ මේ වගේ කතිකාවක් මතු වන්නේ. ශ්‍රීපාලි මණ්ඩපය සිය ඉතිහාසයේ මුහුණ දෙන පළමුවන අර්බුදය මේක. ඒ නිසා අපි ළඟ යෝජනා තියෙනවා අපි ඒවා පසුවට ඉදිරිපත් කරනවා. මේකට තියෙන නව විකල්ප. ඒ නිසා මේ ගැන යළි යළිත් අපි කල්පනා කරලා බලන්න ඕන. මේකට අවශ්‍යයි විද්‍යාත්මක පර්යේෂණාත්මක ප්‍රවේශයක් මේ කරන කාරණය සම්බන්ධව.

අපි දන්නවා අද මේ වෙන කොට අපේ රටේ තියෙන මේ අලුත් තත්ත්වය තුළ එහෙමත් නැත්නම්, පශ්චාත් යුධ ලාංකිය සමාජය තුළ අද අවශ්‍ය වෙලා තියෙනවා ජාතීන් අතර ජන වර්ග අතර විවිධ සංස්කෘතීන් අතර යම්කිසි ආකාරයක සංහිඳියාවක්, යම්කිසි ආකාරයක සහනශීලීත්වයක්, සහජීවනයක්, දේශපාලන විසඳුමක් අවශ්‍ය වෙලා තියෙනවා මේ දශක ගණනාවක් තිබෙන ප්‍රශ්නවලට. ඇත්ත වශයෙන්ම දියුණු සෞන්දර්යාත්මක සහ කලාත්මක චින්තනයකින් සහ විඥානයකින් තොරව කල් පවත්නා දේශපාලන විසඳුමකට යෑම ඉතා දුෂ්කර කාරණයක්.

නමුත් ඒ ගැන කිසිකෙනෙක් කතා කරන් නෑ. අද ඒ නිසා මහින්ද චින්තනයේ ප්‍රධාන කාරණයක් මතක් කරන්න කැමතියි. ජාතික මාධ්‍ය විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමේ ප්‍රශ්නය. මේ පශ්චාත් යුධ ලාංකීය සමාජයේ තිබෙන නව අභියෝග ජය ගැනීම සඳහා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයෙන් ඔබ්බට ගිය නවීන විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම අවශ්‍යයි. ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රධානතම විෂයන් දෙකක් බවට පත්වන්න ඕන ඇත්ත වශයෙන්ම සෞන්දර්යවේදය නැතහොත් ප්‍රසාංගිකකලාව හා ජනමාධ්‍ය අධ්‍යයනය. දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ විඥානය. මනස සකස් කරන යථාර්ථයට ඔවුන්ගේ තියන සම්බන්ධතාවය සකස් කරන, ප්‍රධානතම ආයතන දෙක වශයෙන් අද ඉදිරිපත් වෙන්නේ ජනමාධ්‍ය සහ ප්‍රාසාංගික කලාවයි. අද ඒක ආගමට කරන්න බැහැ. අද ඒක දේශපාලඥයින්ට පමණක් කරන්න බැහැ. ඒක පැහැදිලියි. කරන්න පුළුවන් මේ දෙකට විතරයි මෙන්න මේ අරමුණ ඇතිව අපගේ එක යෝජනාවක් තමයි මෙම විශ්වවිද්‍යාලය කොළඹට සම්බන්ධ වෙලා තිබීම. අපි එයට කැමැතියි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට එකතු කිරීම මේ නිසා තාර්කික වෙන්නේ නෑ. එහෙමනම් තියෙන විකල්පය තමයි යම් කිසි කාලයක් තුළ මෙය ස්වාධීන ජාතික මාධ්‍යය විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම. මෙතන මාධ්‍ය කිවුවාම ප්‍රසාංගික කලාවත් ඇතුළත්වන්නේ පුළුල් මාධ්‍ය අර්ථයෙන්.

එහි ප්‍රධාන අභියෝගය වෙන්න ඕන පශ්චාත් යුධ ලාංකේය සමාජයට අවශ්‍ය කරන අර දේශපාලන විසඳුමකට අලුත් අභියෝගයනට අවශ්‍ය කරන විදිහට මිනිසුන්ගේ සෞන්දර්ය, රසාස්වාදනය, ඔවුන්ගේ විඥානය, ඔවුන්ගේ චින්තනය, ඔවුන්ගේ චර්යාවන්, ඔවුන්ගේ සංවේදීතාවන්, හැඩගැස්වීම. ඒ ගැනයි අද රජය කල්පනා කරන්න ඕන. මම කැමතියි මේ වෙලාවේ ජනපතිවරයාගේ සහ උසස් අධ්‍යාපන ඇමතිවරයාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරන්න. නමුත් මෙය සුළු පටු කාර්යයක් නෙවෙයි. මෙය ඉතා බරපතළ කාර්යයක්. ඇත්තවශයෙන්ම මෙය මේ

රටේ දැවැන්ත අනාගත ප්‍රාග්ධන ආයොජනයක් පිළිබඳ කාර්යයක්. මෙය දෘශ්‍ය මාන නොවුනාට, මෙය විශාල බලපෑමක් කරන්න පුළුවන් කාර්යයක්. මේක අලුත් මානව සම්බන්දතා නිර්මාණය කරන්න පුළුවන් කටයුත්තක්.

විශ්වවිද්‍යාල යුරෝපියානු සංගමය බිහිවීමේදී, මම මේ ළඟදි කියෙව්වා වාර්තාවක් විශ්වවිද්‍යාල පද්ධතිය ඉටු කරලා තියෙන භූමිකාව. නව ආර්ථික, සමාජ, දේශපාලන, සංස්කෘතික, දෘෂ්ටිවාදි ආධ්‍යාත්මික සහ රාජ්‍ය ව්‍යුහයන් හැඩගැස්වීමෙහිලා විශ්වවිද්‍යාලය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කල බව පෙනෙනවා. පොදු යුරෝපය පිළිබඳ අදහස මුලින්ම බිහි වුයේ ආර්ථිකය තුළ නොව දෘෂ්ටිවාදය තුළයි. එය යුරෝපය ප්‍රබුද්ධ ප්‍රජාවේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙසටයි සිදු වුනේ. ඒ අනුව සමකාලින යුරෝපියානු සංගමය බිහිවීම අවශ්‍ය අති දැවැන්ත මානව සම්පතක් නිර්මාණය කලා. අද අපේ රටේ විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට සහ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න අයට රජය අතර සම්බන්ධය ඉතාමත් ඛේදජනකයි. පැත්තකට කොන් කරල දාලා තියෙන්නේ. මේ කට්ටිය නිකන් නිකමෝ වගයක්, නිකම් ගල් යුගයේ ඉන්න කට්ටියක් විදිහට, මේක ජාතික ඛේදවාචකයක්. හැම යුගයකදීම ඒ රටේ සමාජ දේශපාලන නවීකරණ ව්‍යාපාර පිටුපස දැවැන්ත ඇකඩමියාවක් එහෙමත් නැත්නම් විද්වත් පිරිසක්, එහෙමත් නැත්නම් විශ්වවිද්‍යාල ඉදලා තියෙනවා. ඒ කාරණාවවත් තේරුම් ගන්න තරම් අපේ රට තවම ඒතැනට ඇවිල්ලා නැහැ. ඇත්ත එහෙම ප්‍රශ්නයක් තියනවා මෙන්න මේක ඉතා බරපතළ ලෙස කල්පනා කරන්න ඕන ප්‍රශ්නයක්. අපේ රටේ ඇකඩමියාවේ එහෙමත් නැත්නම් ප්‍රබුද්ධ ප්‍රජාවේ වෙනම ගැටලුවක් තියනවා.

පශ්චාත් යුද ශ්‍රී ලාංකේය සමාජයේ ගැටලු නිරාකරණය කිරිමට ආධාරක වන පුළුල් සෞන්දර්ය කලා සහ සංහතික මාධ්‍ය පරිසරයක් ගොඩනැගිය යුතුවීම කාලින අභියෝගයක්. මෙම ගැටලු ජය ගැනීම සඳහාත් අනාගත තව ශ්‍රී ලංකාවට සරිලන්නාවුත් නව පුළුල් දැක්මක් සහ ආකල්පයක් හැඩ ගැස්වීම මේ නව විශ්වවිදයාලයේ එක් මූලික කාර්යක් විය යුතුය.

බුද්ධි ප්‍රජාව මේ රාජ්‍යයක් එක්ක තිබෙන ගණුදෙනුවක් එක්ක තියෙන ගැටලුව. මේ ගැටලුව විවිධ රටවල වෙනස් ස්වරූපයන් ගන්නවා. බුද්ධි ප්‍රජාව හා රාජ්‍ය අතර ජර්මනියේ තිබුණේ වෙනම සම්බන්දතාවක්. ඇමෙරිකාවේ ඊට වඩා වෙනස්

සම්බන්ධයක්. රුසියාවේ තවත් විදිහයකට. බ්‍රිතාන්‍යයේ තවත් විදිහයකට. අපේ රටේ තවත් විදිහකට. උදාහරණයක් ලෙස ප්‍රංශයේ බුද්ධිමතුන් බොහෝම රැඩිකල්. තිරණාත්මකයි. විවේචනාත්මකයි. රාජ්‍ය ව්‍යුහය සකස් වීමට ඔවුන්ගේ බලපෑම බෝහොම සක්‍රිය විදිහට ලැබෙනවා. අදත් එහෙමයි. හැබැයි ජර්මනියේ එහෙම නෙමෙයි. එංගලන්තයේ එහෙම නෙමෙයි. ඊට වඩා බොහොම සාම්ප්‍රදායික බෝහොම ගතානුගතික ස්වරූපයක් ඒ තුළ තියෙන්නේ. ඒ නිසා ඒක සමකාලින මිනිසුන්ගේ ගති ලක්‍ෂණවලින්, චර්යාවන් තුළින් මතවෙනවා. ඒ නිසා අපේ රටෙත් මේ කතිකාව අපි ගෙනියන්න ඕන. ඒ කියන්නේ මේ සෞන්දර්ය අධ්‍යාපනයේ බිඳවැටීම ආධ්‍යාත්මික හා බුද්ධිමය ප්‍රාග්ධනය බිඳවැටීමට හේතුවෙනවා. ඇත්ත වශයෙන්ම එනිසා මේ කතිකාව අලුත් අදහස් ජනිත කරන, කිසිම කෙනෙකුට විරුද්ධ කියන එකක් නෙමෙයි. මේක කිසිම කෙනෙකුට පක්‍ෂව කියන එකක් නෙමෙයි. මේක තියන දේ ඒ විදිහට පෙන්වා දීම. මේක බුද්ධිමතුන්ට කරන්නට පුළුවන් එකම දේ තමයි. සමාජ ක්‍රියාවලින් විශ්ලේෂණය කිරීම, සංශ්ලේෂණය කිරීම සහ ඒ තුළින් නව දැනුම නිෂ්පාදනය කිරීම එම දැනුම මානව සංහතියේ ප්‍රගතියට යොදා ගැනීමේ ක්‍රමවේදයන් නිර්මාණය කිරීම. සංවර්ධන ක්‍රියාවලියෙදි මතු වන ප්‍රති විරෝධතා සමනය කිරීමේ කලාත්මක ස්වරූපය නිර්මාණය කිරීම. මේ කියන දේවල් වලින් නව්‍යතාවන් ඇති කිරීමට නව විකල්පයක් බිහිකර ගැනීමට ප්‍රබුද්ධ තවතවත් කතිකාවන් බිහි විය යුතුයි. ඒවා දිහා වෛර සහගතව නැතිව බොහොම අපක්‍ෂපාතිව නිර්මාණාත්මකව බැලිය යුතුයි. මේ කියන කාරණා දෙස බලලා ඒවායේ තිබෙන හරබර තීන්දු කරගන්න අවශ්‍යයි. අපේ මේ පශ්චාත් යුධ ලාංකීය සමාජයේ සෞන්දර්ය කලා මාධ්‍යයට ප්‍රමුඛ ස්ථානයක් දිය යුතුයි. මෙහිදි ගාමක, නියාමක ආයතනය බවට පත්වන්න ඕන උසස් අධ්‍යාපන අමාත්‍යංශයයි. උසස් අධ්‍යාපන අමාත්‍යංශය තුළ ඔවුන්ට පොදු දැක්මක් තියෙන්න ඕන. බරපතළම කාර්යභාර්ය පැවරිලා තියෙන්නේ ඔවුන්ටයි. ඇත්ත වශයෙන්ම ඒක ඒ විදිහට තේරුම් අරන් තියෙනවාද කියන එක මේ සිදුවන ක්‍රියාවලින් එක්ක බලන කල විශාල ගැටලුවක්. මේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හා ශ්‍රීපාලි මණ්ඩපය එකට එකතු කිරීම පුද්ගල ප්‍රශ්නයක්වත්, ඉඩම් ප්‍රශ්නයක්වත්, ස්ථාන ප්‍රශ්නයක් නෙවෙයි. මෙය පරම පවිත්‍ර විදිහට ම ශාස්ත්‍රලිය ප්‍රශ්නයක් විදිහට තේරුම් අරගෙන එයින් සිදුවන වාසිය අවාසිය අපේ සමාජයට කොහොමද

බලපාන්නේ කියන එක තක්සේරු කිරීමට යම් කිසි ආකාරයට මතයක්, අදහසක් තමයි ඉදිරිපත් කරන්නේ.

සෞන්දර්ය කලා, ප්‍රාසාංගික සහ සංහතික මාධ්‍ය විෂය ක්ෂේත්‍රයේ සංකල්පිත සහ න්‍යායික සංවර්ධනය අද්‍යතන ගෝලීය සහ ජාතික මාධ්‍ය සහ ප්‍රාසාංගික කර්මාන්තයේ, ව්‍යාපාරයේ පොදු රසඥතාවේ අවශ්‍යතා වලට අනුරූපව වර්ධනය කිරීම අප යුගයේ මූලික අභියෝගයයි. සමකාලීන ලෝක තාක්ෂණික සහ සමාජයීය ප්‍රවණතා සහ ගතික වලට අනුව සලකා බැලීමේ දී නම් විෂය ක්ෂේත්‍රවල අනාගතය රැඳී ඇත්තේ බහුවිෂයික, අන්තර්විෂයික සහ පාරවිෂයික සන්දර්භයක් තුළ මේවා දියුණු කිරීමට අවශ්‍ය අවකාශය සැලසීම තුළ බව අපගේ හැඟීමයි.

එනිසා අවසාන වශයෙන් මේක සර්වසාධාරණව අහගෙන ඉඳලා අපේ විද්වත් දේශන වලට සහභාගි වෙලා ඔබටත් පුළුවනි මේ අදහස් වර්ධනය කරන්න. ඔබ මේ සමාජයේ විවිධ බලපෑම් ක්ෂේත්‍රවල ඉන්න අය මෙහි එකතු වෙලා ඉන්නේ. එනිසා අපේ මේ ව්‍යායාමය සුළු වුනත්, මෙහි තිබෙන ඓතිහාසික කාර්යභාරය අති දැවැන්තයි. ඒක තේරුම් අරගෙන අපි කටයුතු කරමුයි, කියමින් කතාව අවසන් කරනවා.

ස්තුතියි

# විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපනයේ කාර්යය හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය තුළ එය පැවැතිය යුතු ආකාරය

ආචාර්ය ලියනගේ අමරකීර්ති

දෙමාපියනි, ශිෂ්‍ය ශිෂ්‍යාවෙනි,

මගේ මාතෘකාව විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යාපනයේ කාර්යය ගැනයි. නමුත් මේ දවසේ ගොඩනැගෙන ශාස්ත්‍රීය අරගලය තුළ දේශනය පිහිටුවන්න මම හිතනව. මම කල්පනා කරන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය පීඨය වන ශ්‍රීපාලිය පිළිබඳවයි. කොළඹ විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයක් ලෙස සම්පූර්ණ වන්නේ නැහැ එයට සෞන්දර්ය පීඨයක් නොමැති නම්. හොරණ තිබුණත්, කොළඹ තිබුණත්. එම නිසා මෙම අරගලය හා කතිකාව අපිට පිහිටවන්න පුළුවන් නම් මේ දවස්වල යෙදිල තිබෙන ආචාර්යවරුන්ගේ වෘත්තිය සටන තුළ, එය වැදගත්. අපි දන්නවා අපේ ජනමාධ්‍ය හරියට වාර්තා කරන්නේ නැහැ. ආචාර්යවරුන්ගේ වෘත්තිය සටන තුළ තිබෙන්නේ හුදෙක් වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එහි තිබෙන ඉතා ආකර්ශනීය හා පොදු මහජනතාවගේ සිත ඇද ගන්නා පාඨයක් තමා ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් වත් අධ්‍යාපනය සඳහා වෙන් කරන්න යයි කියන ඉල්ලීම. මධ්‍යස්ථ යයි පෙනී සිටින මාධ්‍යවත් මෙය වාර්තා කරන්නේ නැහැ. මෙහි තේරුම කුමක්ද? ලංකාවේ දැනට මෙය පවතින්නෙ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.8 ක් හැටියටයි. ලෝකයේ අධ්‍යාපනය සඳහා වෙන්කරන මුදල් අතරින් අප ඉන්නේ ඉතාම පහළ තැනක. එදා මට මතකයි මහනුවරදී මහාචාර්යවරුන් කිව්වා, කියුබාවේ එය 18%යි කියලා. යුරෝපයේ සියයට 5. 5 ත් 6 ත් යන මට්ටමේ ඉන්නේ. ඒ සටන් පාඨය එකතු කරන්න හේතුව තමයි අපේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන හරයාත්මක අංග, පුද්ගලයාගේ මිනිසාගේ විමර්ශන ශක්තිය, විචාරාත්මක බුද්ධිය, තර්ක බුද්ධිය වර්ධනය කරන අංග කප්පාදු කිරීමේ, ඒවා කපා දැමීමේ ප්‍රවණතාවයක් දැන් කාලෙක සිට දක්නට ලැබීම. මේක පශ්චාත් යුධ තත්වයක් නෙවෙයි. කෙනෙකුට කියන්න පුළුවන් මෙය පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ දිගින් දිගටම දක්නට ලැබෙන අංගයක් කියලා.

එදා මම පෞද්ගලිකවම ප්‍රියන්ත ෆොන්සේකා මහතාට කිව්වා ශ්‍රීපාලි අරගලය ආචාර්යවරුන්ගේ පොදු සටන තුළ පිහිටවන්නට පුළුවන්නම්, ඒ ආචාර්යවරුන්ගේ සටන තුළත් දළ ජාතික නිෂ්පාදනයෙන් 6%ක් අධ්‍යාපනයට වෙන් කල යුතුය යන

සටන් පාඨය තුළ අඩංගු කරන්න පුළුවන්නම් ශ්‍රීපාලි අරගලයට වැදගත් මහජන ආකර්ෂණයක් ලබා ගන්න පුළුවන් කියලා. මම එය අදත් විශ්වාස කරනවා.

මම ඇහුවා ශ්‍රීපාලියේ මෙය සංවිධානය කරන ශිෂ්‍යාවකගෙන් කවුද අද ඇවිල්ලා ඉන්නෙ කියලා. එතකොට කිව්වා ශිෂ්‍යයො සහ දෙමව්පියො කියලා. මම හිතන්නේ මෙය ඉතා වැදගත්ම අංගයක්. මහනුවරදී ආචාර්යවරුන්ගේ වෘත්තිය සටන සඳහා රැස්වීමට අපි 700ක් බලාපොරොත්තු උනා. අපි බය වුනා එච්චර එන එකක් නැහැ කියලා. නමුත් 1500 ක් විතර ඇවිල්ලා හිටියා. අවසානයේදී පුටු මදි වුණා. ශාලාව දෙපැත්තේ පිරිස් දේශන ශාලාවේ හිටගෙන දේශන අහගෙන හිටියා. ශිෂ්‍යයෝ හිටියේ 100 ක් විතර. ශිෂ්‍යයෝ බොහෝ පිරිසක් ගෙවල්වල ගොස් හිටියා. සිවිල් බුද්ධිමත්තු, දෙමව්පියෝ, වැඩිහිටියෝ වගේ අය විශාල පිරිසක් එතන හිටියා.

ලංකාවේ දරුවන්ගේ අධ්‍යාපනයේ අන්තර්ගතය දෙස වැඩිහිටියෝ සොයා බලන්නේ නැහැ. විභාගෙ පාස්වෙනවනම් අන්තර්ගතය දෙස බලන්නේ නැහැ. මෙය දෙමව්පියන්ගේ වගකීම පැහැර හැරීමක් . මෙවැනි අවස්ථාවක දෙමව්පියන්ගේ මැදිහත් වීම වැදගත්. නැත්නම් ආණ්ඩුවට අවශ්‍ය වේලාවට ශ්‍රීපාලියට අහවල් දේ හරියනවාද, සෞන්දර්යට අහවල් දේ හරියනවාද කියලා බලන පර්යේෂණ මීයෝ ටිකක් බවට අපේ දරුවෝ පත්වෙනවා. එයට විරුද්ධව අපි නැගිටින්න ඕන. එසේ විරුද්ධව නැගිටින්න පුළුවන් වන්නේ විෂයයන්වල අන්තර්ගතය පිළිබඳව සොයා බලනවානම් පමණයි. ඒ නිසා මම අද දේශනයේ කථා කිරීමට අදහස් කරන්නේ මානව ශාස්ත්‍ර විෂයයන් ඇයි අපට අවශ්‍යවන්නේ, ඒ මානව ශාස්ත්‍ර විෂයන්ගෙනුත් සෞන්දර්ය කලාවත් ලලිත කලාවත් ඇයි අපට අවශ්‍ය වන්නේ, ඇයි අප ඒවා රැකගත යුත්තේ කියන කාරණා පිළිබඳවයි.

මමයි ප්‍රභාතුයි (ආචාර්ය ප්‍රභාත් ජයසිංහ) නිතරම පොඩි ළමයින්ගේ අධ්‍යාපන අන්තර්ගතය ගැන කථාකරනවා. මටයි ප්‍රභාත්ටයි දෙන්නටම පොඩි ළමයි ඉන්නවා. මේ අධ්‍යාපනය සහ අන්තර්ගතය ගැන සොයා බැලීම කොයිතරම් අමාරුද කියල කියන්න මම උදාහරණයකින්ම පටන්ගන්නම්. මගේ ලොකු පුතා පාසලකට බාර දෙන්න හදන වේලාවේ මටයි මගේ බිරිඳටයි අවශ්‍ය වුණා ලෝකයේ උතුම් රට ලංකාවයි කියලා හඳුන්වන්නේ නැති පාසලක්, ලංකාව තමයි ලෝකයේ හොඳම රට කියලා හඳුන්වන්නේ නැති පාසලක් ආචාර්ය මණ්ඩලය අතර දෙමළ, මුස්ලිම්, සිංහල තුන් ජාතියම ඉන්න පාසලක්. පාඨමාලාවේ ලංකාව ලෝකයේ කේන්ද්‍රය ලෙස

හඳුන්වන්නේ නැති පාසලක්. එසේම සිංහල භාෂාව ලෝකයේ එකම භාෂාව ලෙස හඳුන්වන්නේ නැති, සිංහලත් ලෝකයේ තිබෙන භාෂා අතරින් එක් භාෂාවක් පමණක් ලෙස හඳුන්වන පාසලක්. ලංකාව ලෝකයේ එක් රටක් පමණක් ලෙස උගන්වන පාසලක්. එසේම මගේ පුතාගේ පන්තියේ සිංහල, දෙමළ, මුස්ලිම් යන හැම ජාතියෙම ළමයි ඉන්න පාසැලක් අපට අවශ්‍ය වුණා. එහෙම පාසලක් නුවරදී මට හමු වුණා. මම ආණ්ඩුවේ පාසල් පැත්තවත් බැලුවේ නැහැ. මම දැනගෙන හිටියා ආණ්ඩුවේ පාසල් වල ඔය කියන එක අංගයක්වත් නැහැ කියලා. පාසල හම්බ වුණා. නමුත් එම පාසල වෙනුවෙන් අධ්‍යාපන වාරයකට රු 50,000 ක් පමණ ගෙවීමට මට සිදු වුණා. මම ගෙවනවා . නමුත් එයින් ලැබෙන අධ්‍යාපනය තුළින් 21 වන සියවසේ වෙසෙන මගේ දරුවා ඔහුවම තේරුම් ගන්නේ, විවිධ සංස්කෘතීන් තුළින් සැදුණු, විවිධ භාෂා වලින් සැදුණු, විශාල පිරිසක් මානවයන්ගෙන් සැදුණු ලෝකයක තමනුත් එක පුරවැසියෙක් කියන අවබෝධයත් එක්ක. එය ලබා දෙන එක හරිම අමාරුයි. නමුත් ප්‍රභාත් ඇතුළු මම දන්න මගේ යාළුවෝ ඉන්නවා. එම අන්තර්ගතය දෙස අවධානය යොමු කොට කටයුතු කරන. මේවගේ බොහෝ පිරිස් ඉන්නවා. ඔබේ දරුවන්ගේ අධ්‍යාපනය සිදු කෙරෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැන සොයා බැලිය යුතුයි. මහාචාර්යවරු හොඳට උගන්වනවා යන මතයෙහි නොසිටිය යුතුයි. ඒ නිසා මම  සතුටු වෙනවා අද දවසේ දෙමව්පියන් පැමිණ සිටීම පිළිබඳව.

සම්භාව්‍යය විශ්වවිද්‍යාලයන් පිළිබඳ සංකල්පය ඉතාම පරමාදර්ශ විදිහට මම සලකනවා. එක පැත්තකින් කලාව, විද්‍යාව, ලලිත කලාව, සමාජ විද්‍යාව, මානව ශාස්ත්‍ර යන සියලු දේ එක පීඨයක උගන්වන දෙයක් ලෙස සම්භාව්‍ය විශ්වවිද්‍යාල සංකල්පය මම දකිනවා. මෙම ආකෘතිය අප ආරක්ෂා කර ගැනීම අවශ්‍යයි. ඒ නිසා තමයි මම ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලයේ කේන්ද්‍රිය අංගයක් ලෙස හඳුන්වා දුන්නේ. ශ්‍රීපාලිය ස්වාධීන අංගයක් ලෙස නොවෙයි.

මෙවැනි විශ්වවිද්‍යාලවල මානව ශාස්ත්‍ර විෂයන්ගෙන් කෙරෙන්නේ කුමක්ද? තමා සහ තමාගේ සම්ප්‍රදායන් විචාරාත්මකව අගය කිරීමයි මෙහිදි සිදුවෙන්නේ. අපි ලාංකිකයෝ හැටියට, අපේ සම්ප්‍රදායෙන් දැනට අප මත පැටවී තිබෙන, නිවැරදි යැයි අප ඉදිරියේ තිබෙන දේ, යලි පරීක්ෂා කර බැලීම මානව ශාස්ත්‍ර අධ්‍යාපනයේ කාර්යභාර්යක්. එම නිසා විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර අධ්‍යාපනය ලබා පිටවෙන අයගේ ජිවිතය ප්ලේටෝගේ වචනයෙන් හඳුන්වනවානම්

සුපරීක්ෂිත ජීවිතයක්. අපේ හැඟීම්, චින්තනය, හැසිරීම්, චර්යාවන්, අපි තර්ක කරන විධි, අපේ කල්පනාවන් යළි පරීක්ෂා කරන අධ්‍යාපනයක්. සම්ප්‍රදායකින් පැවතගෙන එන්නේ යැයි කියන කිසිම දෙයක් විශ්වවිද්‍යාල මානව ශාස්ත්‍ර අධ්‍යාපනය තුළ භාරගන්නේ නැහැ. මෙය තමයි හුරුපුරුදු විදිහ කියල භාර ගන්නෙත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයේ යහපැවැත්ම සඳහාත්, බලය හෝ අධිකාරිත්වය මගින් තමන් මත පටවන නිසා පිළිනොගෙන ඒවා ප්‍රශ්න කරන පුරවැසියා බිහිකරන ගැනීමටත් අපට අවශ්‍යයි මේ පරීක්ෂිත ජීවිතය. මේ කාරණය නිසා තමයි අපි සාහිත්‍යය, සාහිත්‍ය න්‍යාය, දර්ශනය වැනි විෂයයන් විශ්වවිද්‍යාලය තුළ උගන්වන්නේ.

මේ දිනවල ඇමරිකාවේ විශාල විවාදයක් යනවා මානව ශාස්ත්‍ර පීඨවලට යොදන මුදල් අඩු නිසා. මෙය ලෝකය පුරාම වර්තමාන ගෝලීය ධනවාදය තුළින් ඇතිකරන ප්‍රවණතාවක්. මෙය ලෝකයේ ධනවාදය සහ එහි අධ්‍යාපන ප්‍රතිපත්ති තුළින් වෙන් කර ගත හැකි දෙයක් නොවෙයි. එනිසා මෙම ප්‍රශ්නය අපි හිතනවාට වඩා ගැඹුරුයි. නමුත් ප්‍රශ්නය ගෝලීයයි.

මේ අය සෞන්දර්ය, මාධ්‍ය අධ්‍යයනය යන විෂයන් දෙස බලන්නේ රැකියා ලබාදෙන්න පුළුවන්ද බැරිද යන කාරණය මුල් කරගෙනයි. සින්දුවලට නටන්න කීදෙනෙක් ඕනැද, නැටුම් කණ්ඩායම් වලට කීදෙනෙක් ඕනැද, කැමරාකරණයට කීදෙනෙක් ඕනැද , ටෙලි නාට්‍යවල රගපාන්න කී දෙනෙක් ඕනැද යන මේවා මුල් කරගෙනයි. නමුත් මේ සෞන්දර්ය අධ්‍යාපනය නොවේ. මෙය සෞන්දර්ය පිළිබඳ යම් අධ්‍යාපනයක් ලබා රැකියා සොයාගැනීමක් විතරයි. සෞන්දර්ය, මානව අධ්‍යාපන ශාස්ත්‍රය තුළ පිහිටුවා බැලූ විට එය ඊට වඩා වැදගත් කාර්යයක්. ඒ ගැනයි මම ඔබේ අවධානය යොමු කරන්නේ.

සත්ත්ව රාජධානියෙන් තමන් පිටවුණු තැන ඉඳල ප්‍රධාන තේමා තුනක් ගැන මානවයා කල්පනා කරල තියෙනව. ලෝකය පිළිබඳ, අප පිළිබඳ හා සොබා දහම පිළිබඳ සත්‍යය. දෙවන කරුණ ආචාර ධර්ම නැතිනම් හොඳ නරක. අපි එකිනෙකාට යහපත් වන්නේ කොහොමද? සමාජය හොඳ විදියට හා ගුණ ධර්ම සහිතව සකස් කරන්නේ කොහොමද? තුන්වැනි එක සුන්දරත්වය. ශිෂ්ටාචාරය ගොඩනැගී තිබෙන්නේ සත්‍ය, ආචාර ධර්ම සහ සුන්දරත්වය යන මෙම ඥානමය මුල්ගල් තුන මතයි. එමනිසා අපට පෙනෙනවා බටහිර දර්ශන ඉතිහාසය තුළ,

විශේෂයෙන් 16 වන සියවසෙන් පසුව, 17, 18 වන සියවස් වන විට මෙම කතිකාව තිව්‍ර වෙනවා. සුන්දරත්වය අගය කරන්නේ කෙසේද? නිර්මාණය කරන්නේ කෙසේද? එය මානව ජිවිතයට වැදගත් වන්නේ ඇයිද? කියන කාරණා පිළිබඳ කතිකාව ගොඩනැගෙනව. එම නිසා අප පිළිගත යුතුයි ඔබ හොරණ ලබන අධ්‍යාපනයත්, කොළඹ ලබන අධ්‍යාපනයත්, සෞන්දර්යයේ ලබන අධ්‍යාපනයත් ශිෂ්ටාචාරයේ අවශ්‍යතාවන් බව. එය රැකියා වෙළඳපොළ පිළිබඳව අවශ්‍යතාවක් නොවෙයි. උත්සව අවස්ථාවලට, ජනමාධ්‍යයට අවශ්‍ය නැටුම් කණ්ඩායම් සැපයූ විට මෙම නැටුම් පිළිබඳ අධ්‍යාපනය කෙළවර වෙනව කියල සිතිම ඉතාමත් වැරදියි. එතනදි අපි ඉන්නේ ගෝලිය ධනවාදය මේවගේ විෂයයන් දිහා බලන දෘෂ්ටිය තුළමයි. අපි තේරුම් ගන්නෙ නැත්නම් මේවා ශිෂ්ටාචාරමය අවශ්‍යතා කියල, අපිට හරි අමාරුයි මේ සටන ජය ගන්න. මේවා ආරක්ෂා කරන්න.

මේ දිනවල ඇමරිකාවේ මානව ශාස්ත්‍ර අධ්‍යාපනයට අරමුදල් කපා හැරිමට එරෙහිව නිතරම New York Times පුවත්පතට ලියන මහාචාර්යවරියක් වන මාර්තා දස්තෝවිස් කියන විදියට ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රාණය ආරක්ෂාකර ගැනිමට නම් අපට වහා අවශ්‍යවන්නේ මානව ශාස්ත්‍ර විෂයයන් මගින් වගා කරන ශක්‍යතාවන්. එය ඉහළ නැංවීම හා රැක ගැනීම අවශ්‍යයි.

ඉන් අදහස් වන්නේ අන්‍යයන් සමග (අන්‍යයන් විවිධ වෙන්න පුළුවන්. ජන වාර්ගික අන්‍යයෝ, සංස්කෘතික අන්‍යයෝ, ස්ත්‍රී පුරුෂ විදියට) ගෞරවයෙන් වාද විවාද කිරිමේ හැකියාව, අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව. නරක හෝ වැරදි තර්කයක් හොඳ හෝ නිවැරදි තර්කයක් අතුරින් වෙන්කර හඳුනා ගැනීම කරන්නේ ස්වභාවික විද්‍යාවෙන් නෙවෙයි මානව ශාස්ත්‍ර විෂයයන් තුළින්. සම්ප්‍රදාය හා බැඳුණු අගතීන් සොක්‍රටිස් කළ ලෙස වාද විවාද කර විවිධාකාර ලෙස ප්‍රශ්න කිරිම අපි මෙම මානව ශාස්ත්‍ර විෂයන් තුළින් විශ්වවිද්‍යාලවලදි වර්ධනය කරනු ලබනව.

පසුගිය දවසක මම ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන එක්ක කතා කරනකොට ඔහු පැහැදිලි කර දුන්නා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය තුළ තිබෙන හරයාත්මක පසුබිම තුළ හොරණ ශ්‍රීපාලි අධ්‍යාපනය පිහිටුවීමේ හැකියාව. ඒත් එක්කම ආචාර්ය ටියුඩර් විරසිංහ කිව්ව එක්තරා ආකාරයක සම්ප්‍රදාය යළි සලකා බැලීමේ සෞන්දර්ය අධ්‍යයනයක් අවුරුදු 10-12 තිස්සේ ඔවුන් හොරණ තුළ වගාකරමින්

ඉන්නවා කියා. මේ වගා කරමින් සිටින, වැඩෙමින් ඉන්න පැළය කඩා දැමීමට එරෙහිව අපි කතා කළ යුත්තේ එනිසයි.

ඒනිසා අපි මානව ශාස්ත්‍ර විෂයයන් තුළ ඇති සංස්කෘතිකමය හා ශිෂ්ටාචාරමය කාරණය තුළ මෙම විෂයයන් ආරක්ෂා කර ගැනීමෙහිලා හරයාත්මක ප්‍රවේශයකින් ප්‍රවේශ විය යුතුයි. මානව ශාස්ත්‍ර විෂයයන් හැටියට ඇයි අපි සෞන්දර්ය අධ්‍යාපනය රැකගන්න ඕනෙ? ඇයි ඒ විෂයයන් විශ්වවිද්‍යාලයට අවශ්‍ය? අපේ ශිෂ්ටාචාරයට අවශ්‍ය අංග සම්පූර්ණ විශ්වවිද්‍යාල තුළ මේවා තිබිය යුත්තේ ඇයි? මෙම ප්‍රශ්නයට උත්තර දීම තරමක් අමාරුයි. නමුත් මෙම ප්‍රශ්නයට උත්තර පශ්චාත් බුද්ධි ප්‍රබෝධ යුගයේ යුරෝපයේ දාර්ශනිකයෝ සපයල ඉවරයි. මෙම ප්‍රශ්නයට උත්තර කාන්ට්, ශිලර් වගේ අය සපයල ඉවරයි. එකම දේ එම උත්තර පිළිබඳ අවබෝධය අපේ දේශපාලඥයන්ට් තියෙන බව පේන්නේ නැහැ. ඒක විශාල අවාසනාවක්. එනිසයි මම මුලින් කිව්වෙ දෙමාපියෝ හා ශිෂ්‍යයෝ එවගේම ආචාර්යවරු එකතු වෙලා මෙම අන්තර්ගතයන් පිළිබඳ සොයා බැලීමේ හා දේශපාලකයින් අභිමුව එම තර්ක ගොඩ නැගීමේ අවශ්‍යතාව දැන් තියෙනව කියල.

මම පොඩි උපුටනයක් කියන්නම් මොකටද සෞන්දර්ය තියෙන්න ඕන කියලා. මම මුලිනුත් කිව්වා මානව ශිෂ්ටාචාරයේ ගොඩනැගුණු බුද්ධිමය කුළුණු තුනක් ගැන. සත්‍යය පිළිබඳ ගවේෂණය, ආචාරධර්ම හෙවත් නිවැරදිව සමාජ සංවිධානය කරන්නේ කොහොමද යන්න වගේම අපිත් ලස්සන වෙලා ලෝකයත් ලස්සන වෙන්නෙ කොහොමද සහ ලෝකය ලස්සන අගය කරන්නෙ කොහොමද, ලස්සනෙහි විචිත්‍රත්වය හා විවිධතාව අගය කරන්නේ කොහොමද කියන කතිකාව. එයට අපි කියනවා Aesthetics කතිකාව කියල. ඒක බටහිර දර්ශනයේ එක් වැදගත් කොටසක්. අර්න්ස්ට් කැසිරර් (Ernst Cassirer) මෙහෙම කියනවා. “භාෂාව හා විද්‍යාව යථාර්ථයේ සංක්ෂිප්තකරණයක්. කලාව යථාර්ථයේ තීව්‍රකරණයක්. ජීවිතයේ පොහොසත් බව, වාග්මය හෝ විද්‍යාත්මක දුප්පත්කරණයන්ගෙන් ආරක්ෂා කරගත හැකිවනුයේ කලාවට පමණයි.”

අනෙක් අදහස නම් “යථාර්ථය සම්පූර්ණයෙන්ම දැනගත හැකිය. දැනගෙන පාලනය කළ හැකිය යන විද්‍යාත්මක තර්කනයන්ට එරෙහිව ඥානමය සමබරතා ඇති කරන්න කලාවට හැකිය” යන්නයි.

මම අර්න්ස්ට් කැසිරර්ගේ මෙම උපුටනය ගත්තේ සම්භාව්‍ය විශ්වවිද්‍යාලය තුළ සෞන්දර්ය තිබිය යුත්තේ මන්ද යන කතිකාව යුරෝපයේ තිබුණු ආකාරය පහදන්නයි. විද්‍යාඥයා ලෝකයේ ස්වභාවික වස්තූන් හෝ භෞතික දේවල් සංක්ෂිප්ත කරලා, කඩලා බිඳලා කරන විද්‍යාත්මක සත්‍යය අත අරින්න ඕන කියන එක නෙමෙයි මෙහි තිබෙන තර්කය. එය ඉතාම වැදගත් දෙයක් ශිෂ්ටාචාර ගමනට. නමුත් එමගින් එහි තිබෙන ජීවිතයට එකතු කරන පොහොසත් බව, බහුවිධ බව, විචිත්‍ර බව ආරක්ෂා කිරීමට සෞන්දර්යත් විශ්වවිද්‍යාලයේ වහල යටම තිබිය යුතුයි යන සම්භාව්‍ය විශ්වවිද්‍යාලය පිළිබඳ අදහස වැදගත්. ඒ අර්ථයෙන් ලංකාවෙ හැම විශ්වවිද්‍යාලයකම සෞන්දර්ය ඉගැන්විය යුතුයි. එසේ ඉගැන්විය යුත්තේ නැටුම් කණ්ඩායමක් බිහිකිරීමේ හෝ සංගීත කණ්ඩායමක් බිහිකිරීමේ අදහසකින් නෙවෙයි. එනිසයි ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන සමග මම කිව්වෙ දර්ශන අංශය, සමාජ විද්‍යා අංශය, දේශපාලන විද්‍යා හා ඉතිහාසය අංශ තීරණාත්මක වැඩකොටසක් කරන, සෞන්දර්ය අධ්‍යාපනයේ අන්තර්ගතය පිළිබඳව තීරණාත්මක මැදිහත්වීමක් කරන, සෞන්දර්ය පාඨමාලාවන් වර්ධනය කරන එක ඉතාම අවශ්‍යයි කියල. මම දන්නව සමහර විශ්වවිද්‍යාලවල එහෙමයි වෙන්නේ. ලලිත කලා අංශයේ අය ඉතිහාස අංශයේ, සමාජ විද්‍යා අංශයේ පාඨමාලාවන් අනිවාර්යයෙන් ඉගෙනගත යුතුයි. දර්ශන අංශයේ නම් සෞන්දර්ය අංශයේ විෂයයන්ගෙන් 50% ක් විතර අනිවාර්යයෙන් උගන්වනවා. ඊකට හේතුව සෞන්දර්ය අධ්‍යාපනය කියන්නෙ නැටුම් කණ්ඩායමක් හදන එක නොවෙයි. ඊට වඩා බරපතළ ඓතිහාසික ශිෂ්ටාචාරමය කාරණයක් මෙතන තිබෙන එකයි.

ඒවගේම සෞන්දර්ය ඉගෙන ගැනීම  වැදගත් දෙයක් තමයි. මම දැකල තියෙනවා, ඔහු පැරණි උපාධිධාරියා සහ නව උපාධිධාරයා පෙන්වීමට අරන් එනවා Power Point Presentation එකක්. රොටරි ෆෝන් එකක් පෙන්වනවා පැරණි උපාධිධාරියාට, නව උපාධිධාරියාට Cell phone එකක් පෙන්වනවා. Cell Phone එක පොටෝ ගන්න පුළුවන්, එස්. එම්. එස්. යවන්න පුළුවන්, හරි ලේසියි, Multi- Purpose. ඔහු කියන පරිදි නව උපාධිධාරියාලු. මම දැක්ක ඒක බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙදි. එතන සිටි කිසිම මහාචාර්යවරයෙක් මේක ප්‍රශ්න කළේ නැහැ. අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙම උපයෝගිතාවාදී, උපකරණවාදී ප්‍රවේශයෙන් ලලිත කලා අධ්‍යාපනය හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය කිසිම දවසක තේරුම් ගන්න බැහැ. සෞන්දර්ය අධ්‍යාපනය තුළ සෞන්දර්ය මානව ශිෂ්ටාචාරයට කරන වැදගත්ම

මතක් කිරීම තමයි කරනීය තර්කනයෙන් නැතිනම් උපකරණමය තර්කනයෙන් මෙම විෂයය තේරුම් ගන්න බැහැ කියන එක. මේකට උත්තරයක් දුන්න එමැන්නුවෙල් කාන්ට් Critique of Judgements කියන පොතේදි. ඔහු කිව්ව සෞන්දර්ය ඥානන මාර්ගයක් ලෙස ඉදිරිපත් කරල, සෞන්දර්ය ඥානන මාර්ගයක් ලෙස අපේ මානව කතිකාව තුළ තිබිය යුතුයි කියල කියන්න එපා. සෞන්දර්ය ඥානන මාර්ගයක් ලෙස විද්‍යාව සමග තරගයකට ගියහොත් පරදින්න ඉඩ තියෙනව. ඒක නෙමෙයි කළ යුත්තේ. සෞන්දර්ය, අපේ පංච ඉන්ද්‍රියන් ඔස්සේ අප අමතා, අප අවදිකර, අප කිතිකවා, අප උනන්දු කරවා ලෝකය වෙත, මානව සමාජය වෙත අප අලුත් විදියකට සම්බන්ධ කළ යුතුයි කියල. ඒ ඔස්සේ තර්ක කරන සමහර අය, එනම් මගේ ගුරුවරියක් වන එලිසෙබෙත් ග්‍රොස් කියන පරිදි සෞන්දර්යයෙන් සිද්ධ වෙන්නෙ අප දෛනිකත්වයෙන් එළියට අවදි කිරීමයි. මොකක්ද දෛනිකත්වය කියන්නෙ? අපි උයනකොට, රෙදි හෝදනකොට, නානකොට, දත්මදිනකොට එන්නෙ දෛනිකත්වයයි. සෞන්දර්යයෙන්, නැටුමෙන්, සංගීතයෙන්, චිත්‍රයෙන් අප කරනු ලබන්නේ මේ දෛනික රිද්මයෙන් මොහොතකට අප කඩලා වෙන් කිරීමයි. ඒ නිසා තමයි නැටුමයි ඇවිදීමයි අතර වෙනසක් වෙලා තියෙන්නේ.

මම දවසක් හොරණදි දේශනයකදී කිව්වා, අපේ එදිනෙදා දවසෙදී, ඇවිදීමෙදි අපේ ශරීර චලනය කරනවට වඩා නැටුම වෙනස් නිසා, නැටුම මූලික වශයෙන්ම අපේම ශරීරයට එරෙහිව ගසන කැරැල්ලක් කියල. ඒ ගසන කැරැල්ලේදි තමයි අපි තේරුම් ගන්නෙ, අපේ දිනපතා යථාර්ථය යළි වෙනස් කරන්න, කඩා බිඳ දමන්න, එය නැවත සකසන්න ආවේශය සපයන්න පුළුවන් සංගීත ශිල්පියාට, නැටුම් ශිල්පියාට බව. ඒ නිසා මේවා විප්ලවීය වැඩ. ඒ නිසා නිහඬ' විප්ලවයක් කරනවා සෞන්දර්ය අධ්‍යාපනය. දැන් මේ තමයි විශ්ව විද්‍යාල හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය පිළිබඳ සම්භාව්‍ය ප්‍රවේශය.

අපේ අධ්‍යාපනය එන්න එන්නම උපයෝගිතා තර්කනයෙන් වහගන්න හදන වේලාවක අපට එයින් මිදෙන්න පුළුවන් වැදගත්ම විදියක් තමයි විශ්වවිද්‍යාලය හා අධ්‍යාපනය පිළිබඳව සම්භාව්‍ය හර පද්ධතිය යළි ආරක්ෂා කර ගැනීම. එය ඉතා වැදගත්, එතනින් තමයි අපි ප්‍රවේශ විය යුත්තේ.

බ්‍රිතාන්‍ය ලේඛිකාවක් වන ජෙනට් වින්ටර්සන්ගේ "කලාව විරෝධය පායි - (Art Objects)" යන කෘතියෙදි ඇය කියනවා එන්න එන්නම ගෝලීය ධනවාදයට

සෞන්දර්යට කලාව තේරුම් ගන්නට බැරි බව. සෞන්දර්ය කලාව මුදල් සංස්කෘතියට (Money Culture) තේරුම් ගන්න බැරි බව. ඇය ප්‍රවේශ ගණනාවකින් මෙය විස්තර කරනවා.

මුදල් සංස්කෘතිය කියන්නෙ මේකයි. මුදල් සංස්කෘතිය තුළ මානවයාගේ අගය මැනෙන්නේ උදේ 8ට වැඩට ඇවිත් හවස 4.30 වන තෙක් කොතරම් වැඩ කරනවද කියන අර්ථයෙන්. වින්ටර්සන් කියනවා මුදලේ මේ අර්ථයෙන් කලාකරුවාගේ කාර්යය තේරුම් ගන්න බැහැ කියල. ඇය කියනවා විනාඩියක සංගීත කණ්ඩයක් නිර්මාණය කරන්න මාස ගණන් නිදිවරමින් හිතන්න, වැඩ කරන්න වෙනව කියල. එම කාලය, නිර්මාණික ශක්තිය, ශ්‍රමය මුදල් වලින් මැනිය නොහැකියි කියල.

එම නිසා සෞන්දර්ය කලාව අපි ආරක්ෂා කරගත යුතු එක් හේතුවක් තමයි, මුදලේ තර්කනය පිළිබඳ සමාජයක, මුදලේ තර්කනයට එරෙහිව පිහිටා සිටීමට අපට ගත හැකි ක්‍රියාමාර්ගයක් වීම. ශිෂ්ටාචාරය තුළ කලාව කර තිබෙන්නේ මෙවැනි කාර්යයක්.

මම මගේ දේශනය මෙතනින් අවසන් කරන්නම්. වින්ටර්සන් කියන විදියට “කලාකරුවා කාලය මුදල් බවට පත් නොකරයි. කලාකරුවා කාලය ශක්තිය බවට පත් කරයි. ශක්තිය බව අදහස් කරනුයේ අර්ථමය ශක්තියයි. එනම් ඉන්ද්‍රියමය වශයෙන් අප කිති කැවීමට හැකි ශක්තියයි. ඔහු කාලය තීව්‍රතාවය බවට පත් කරයි. එනම් කලාකරුවා ජීවිත කාලයක මානව අත්දැකීමක් එක සිනමා පටයක එක රූප රාමුවකට තීව්‍ර කිරීම, ස්වර කණ්ඩයකට තීව්‍ර කිරීම, එක් සංගීත කණ්ඩයකට තීව්‍ර කිරීමයි. කලාකරුවා කාලය ජීවන දැක්මක් බවට පත්කරයි.” මුදලේ සංස්කෘතියට එරෙහිව කලාකරුවා මෙම කාර්යයන් කරන නිසා ඇය කියනවා කලාව අවසාන වශයෙන් පවතින දෛනිකත්වයට, යථාර්ථයට එරෙහිව කැරලි ගසන එක ක්‍රමයක් කියල.

දැන් මම කිව්වා, මානව ශාස්ත්‍ර අධ්‍යාපනය තුළ අපට අපේ සංස්කෘතිය යැයි සිතා සිටින දේ යළි ගොඩනැගීම, යලි සිතා බැලීම මානව ශාස්ත්‍ර අධ්‍යාපනයේ කාර්යයක් කියා. ඒ මානව ශාස්ත්‍ර අධ්‍යාපනයේ අරමුණට සෞන්දර්ය කලාව දායක වන එක ක්‍රමයක් තමයි මුදලේ සංස්කෘතියට එරෙහිව පිහිටා තිබීමට සෞන්දර්ය කලාවන්ට

ඇති හැකියාව. එනිසයි මම මුලින්ම කිව්වේ, දෙමව්පියනි, ඔබ මෙතනට පැමිණ සිටීම අද ඉතා වැදගත් කියා. ඔබ අපේ අධ්‍යාපනයේ අන්තර්ගතය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් කාර්යයක් කියා.

ඒ නිසා මම කියන්නේ නැවත වරක් මෙම අරගලය හුදෙක් අපේ අධ්‍යාපනය පිළිබඳව මෙම රජයෙහි, නැතිනම් අපේ පශ්චාත් යටත් විජිත ලංකාවේ අධ්‍යාපනය පිළිබඳව එක්තරා ප්‍රවේශයක එලයක්! ඒ අය හිතන්නේ සෞන්දර්ය අධ්‍යාපනය කියන්නේ, නැටුම් කණ්ඩායමක් බිහිකරන එක නැත්නම් සංගීත කණ්ඩායමක් බිහිකරන එක කියල. ඊට වඩා වැදගත් භරයාත්මක කාර්යයක් අපේ විෂයයන්ට තිබෙන බව පෙන්වා දෙමින් ඒ සටන් පාඨය ආචාර්යවරුන් හා විශ්වවිද්‍යාල ප්‍රජාව දැන් ගෙන යන අර මහා සටන තුළ පිහිටු වීම අවශ්‍යයි. එසේ පිහිටවීමෙන් තමයි මෙම සටන ජය ගත හැක්කේ. එවැනි කතිකාවතක යෙදෙන්නට ඔබට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙන්නම්.

ස්තූතියි.

## ලංකාවේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනයේ ගැටලු සහ එහි අභියෝග

**ආචාර්ය මයිකල් ප්‍රනාන්දු මහතා.**

හිතවත් මිත්‍රවරුනි, සහෝදර සහෝදරයනි,

මා මුලින්ම කැමතියි පොඩි හැඳින්වීමක් මා ගැන කරන්න. කයිවාරුවක් වශයෙන් නොවෙයි. මම පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ තමයි මගේ ප්‍රථම උපාධිය කලේ. ඉන්පසුව ඒ වන විට ලෝකයේ තිබුණු මට හිතෙන විදිහට දියුණුම සමාජවාදි රට වූ ජර්මනියේ, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදි ජන රජයේ "හුන්ගෝල්ඩ් විශ්වවිද්‍යාලයේ සහ බර්ලිනා අන්සම්බල් ආයතන දෙකේ තමයි මගේ ආචාර්ය උපාධිය කලේ. ඉන්පසුව Fullbright ජ්‍යෙෂ්ඨ පර්යේෂණ දීමනාවක් ලැබිල ඇමරිකා එක්සත් ජනපදයෙ වොෂිංටන් විශ්වවිද්‍යාලයේ කලා අංශයේ නාට්‍ය කලා අංශයේ පර්යේෂණ සහ දේශන පැවැත්වුවා. ඒ වගේම ඒ කාලය තුළම නිව්යෝක් සිටි යුනිවර්සිටියේ තියෙන උසස් නාට්‍ය කලා අධ්‍යපන ආයතනයේත් දේශන සහ පර්යේෂණ කටයුතු වල යෙදි සිටීමට සිදුවුණා. ඒ වගේම ඉන්පසුව මට අවස්ථාව ලැබුණා ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේ කලා අධ්‍යාපනය පිළිබඳව විශේෂ අධ්‍යාපන විශ්වවිද්‍යාලයේ කලා අධ්‍යාපනය පිළිබඳව පර්යේෂණයේ යෙදෙන්න මාස ගණනක්.

ඒ පර්යේෂණ මත මා විසින් සොයා ගත් කරුණු සහ බැසගත් නිගමන තමයි, මා මෙහිදි ඔබ වෙත ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නෙ. බොහෝ කරුණු දැනට ඉදිරිපත් වෙලා තියෙන හින්දා මම බොහොම දළ වශයෙන් කිවයුතු දේ පමණක් කියන්න උත්සාහ කරනවා. අපේ රටේ විශ්වවිද්‍යාල 19ක් තිබෙනවා. ඔක්කෝම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ තියෙන ඒවා නෙවෙයි. එහෙම නැත්නම් උසස් අධ්‍යාපන ඇමතිවරයා යටතේ නැති විශ්වවිද්‍යාල දෙකක් තිබෙනව. ඒ විශ්වවිද්‍යාල ලංකාවෙ තියෙන විශ්වවිද්‍යාල 19න් 07ක සෞන්දර්ය විද්‍යාව උගන්නවා. යාපනය විශ්වවිද්‍යාලයේ වෙනම ආයතනයක් තියෙනව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය විද්‍යා ආයතනය කියල. කොළඹ විශ්වවිද්‍යාලයට තියෙනවා ශ්‍රීපාලි මණ්ඩපය. පේරාදනිය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අංශයක්, කැලණිය විශ්වවිද්‍යාලයේ මං හිතන්නෙ ලලිත කලාව පිළිබඳව අංශ දෙකක් තියෙනවා. මේ ආකාරයට අර බොහෝ මට පෙර කතා කළ විද්වතුන් ප්‍රකාශ කළ අන්දමට බැලූ

බැල්මට කාට හරි හිතෙන්න පුළුවන් මොකටද මේ තරම් සෞන්දර්ය විද්‍යාව කියල. මේක තමයි මූලික ප්‍රශ්නෙ. මේක තමයි පෙන්නෙත් නැත්තේ. එහෙම නැත්නම් දකින්න බැරි. මට නම් සැකයක් නෑ ඔවුන් මේ ක්‍රියා කරන්නෙ කොහෙන්දෝ එන අණක් ක්‍රියාත්මක කිරීමක් සඳහා පමණයි කියල. සෞන්දර්ය විද්‍යාව උගන්වනවට වැඩිය වෙන වැඩකට මෙම ඉඩම් යොදා ගන්න බැරිද කියන මානසිකත්වයකින් තමයි මේ ගොල්ලො වැඩ කරන්නෙ.

එතකොට අපි බලමු. ඇත්තටම ලංකාවේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ තත්ත්වයට මොකද වෙලා තියෙන්නේ කියල දැන්. මා කියපු විදිහට ලංකාවේ විශ්වවිද්‍යාල 7ක සෞන්දර්ය විද්‍යාව නොයෙක් ප්‍රමාණවලින් උගන්වනවා. එක විශ්වවිද්‍යාලයක් සම්පූර්ණයෙන්ම සෞන්දර්ය විද්‍යාව උගන්වනවා. මෙතනදි අපි බලන්න ඕනේ පවතින යථාර්ථය. අපේ රටේ සෞන්දර්ය අධ්‍යාපනය ඒ කියන්නෙ සෞන්දර්ය විද්‍යාව කියන්නේ ඔය වෙන රටවල් වල ඇමරිකාවෙ වුණත් නිකම්ම නළුවන් පුහුණු කිරීම අධ්‍යක්ෂකවරුන් පුහුණු කිරීම නවකතා ලියන අය පුහුණු කිරීම වගේ කටයුත්තක් නෙවෙයි. අපේ ඉතිහාස දිහා බලපුවහම අපට පෙනෙනව 1956 බණ්ඩාරනායක ආණ්ඩුව පත් වෙන්න මාස ගණනකට ඉස්සෙල්ල පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ තිබුණා සම්මන්ත්‍රණයක් යුනෙස්කෝ ආයතනය විසින් සංවිධානය කරපු. එකේ මාතෘකාව වුනේ “සාම්ප්‍රදායික සිංහල කලා”. අන්න එතනදි ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරු කිසියම් නිගමනයකට ආපු බව පේනවා. ඒ නිගමනය මත තමයි පසුව ඔය පේරාදෙනිය ගුරුකුලය බිහිවුනේ. පේරාදෙනිය ගුරුකුලය කාටහරි විවේචනය කරන්න පුළුවන් හොඳ වැඩත් කෙරිලා තියෙනවා. සමහර ඒව විවේචනය කරන්න පුළුවන්. නමුත් සමස්ථ වශයෙන්ම එහි දායකත්වය අපට අමතක කරන්න බැහැ. මේ විදිහට අපි 56 ජනතා ජයග්‍රහණයේ දේශපාලන වශයෙන් එළඹෙන්නට පෙර සංස්කෘතික වශයෙන් සෞන්දර්ය කලා ක්ෂේත්‍රය තමයි මේකෙ ඉස්සරහට ආවෙ. ශාස්ත්‍රිය වශයෙන් ඊළගට අපි දන්නවා අපි අද කතා කරන්නෙ පේරාදෙනිය ගැන වෙන මොනවත් නිසා නෙවෙයි. පේරාදෙනිය වෛද්‍ය විද්‍යාලය නිසාවත්, ලංකාවෙ තියෙන එකම දන්ත වෛද්‍ය පීඨය තියෙන නිසාවත්, ලංකාවෙ තියෙන එකම සත්ව වෛද්‍ය විද්‍යාව උගන්වන නිසාවත් නෙවෙයි. සරත්චන්ද්‍රල, සිරි ගුණසිංහල, ගුණදාස අමරසේකරල එහෙ ඉඳල කරපු නිසා ඒක වෙනම සංස්කෘතියක් බිහි කරල තියෙනව. අනිත් පැත්තෙන් බලපුවහම අපේ රට බහු ජාතික, බහු ආගමික, බහු භාෂික, බහු

සංස්කෘතික රටක්. ඒ නිසා යාපනයේ උගන්වන යාපනයේ පර්යේෂණ කරන සෞන්දර්ය විද්‍යාවම නෙවෙයි සමහර විට පේරාදෙනිය කෙරෙන පර්යේෂණ. පේරාදෙනියෙ තියෙන ඒ කඳුකර සම්ප්‍රදායන් පදනම් කොටගෙන කෙරෙන පර්යේෂණම නෙමෙයි ශ්‍රීපාලි ආයතනයේ කෙරෙන්නෙ. ඒකෙ ඊට වැඩිය වෙනම මාර්ගයක ගමන් කරනවා. සෞන්දර්ය විශ්වවිද්‍යාලයත් යම්කිසි මාර්ගයක ගමන් කරනවා ඇති.

දැන් මේ නිසා පැහැදිළිවම අපේ රටට අපේ හැම විශ්වවිද්‍යාලයකටම කිසියම් ආකාර වූ සෞන්දර්ය විද්‍යා අංශයක් තිබිය යුතුයි. අර මට පෙර කතා කළ කෙනා කියපු විදිහට මේකෙ දෙපැත්තක් තියෙනවා. මොන විද්‍යාවන් ඉගෙන ගත්තත්, වෛද්‍ය විද්‍යාව ඉගෙන ගත්තත්, ශුද්ධ විද්‍යාවන් ඉගෙන ගත්තත්, කෘෂිකර්මය වෙන්න පුළුවන් මේව ඉගෙන ගන්න අයට හුදකලාව මේව ඉගෙන ගන්න බෑ. කලාව කලා ආශ්වාදය මේ හැම කෙනෙකුටම අවශ්‍යයි. ඔවුන්ගේ ජිවිතය, ඔවුන්ගෙ අධ්‍යාපනය පෝෂණය වෙන්න නම් ඒ හැම තැනකම තියෙන්න ඕනෙ, ලලිත කලා එහෙම නැත්නම් සෞන්දර්ය විද්‍යා ආයතනයක් ඒ කටයුතු වලට. මේකෙ දෙපැත්තක් තියෙනවා. අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනයක් ලැබෙන තත්ත්වයක්. දැන් පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මගේ අත්දැකිම අනුව ලලිත කලා අංශයක් තියෙනවා. මේ ලලිත කලා අංශයේ ඉගෙන ගන්නවා ඉංජිනේරු පීඨයේ ශිෂ්‍යයො, විද්‍යා පීඨයේ ශිෂ්‍යයෝ තවත් තමන් කැමති විෂයක් ඒ වගේම බොහෝ කලා පීඨයේම වෙනත් අංශ වල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ. කලා විෂයනුත් සිනමාව, නාට්‍ය කලාව ඒ විතරක් නෙවෙයි ඩිජිටල් තාක්‍ෂණය සහ පරිගණක සාක්‍ෂරතාව ලබා ගන්නත් එන්නේ ලලිත කලා අංශයට. මට පොඩි එකඟ වෙන්න බැරි කරුණක් තියෙනව. මේ අපේ වීරසිංහ ආචාර්යතුමා එක්ක. එතුමා කිව්වා මේ ලංකාවෙ ලලිත කලා අධ්‍යාපනය මගින් 21 වන ශතවර්ෂයේ ලෝකයේ ඕනෑම තැනකට ගැලපෙන බුද්ධිමතුන් බිහි කරල නැතෙයි කියල හිතනවයි කියලා. එහෙම අය බිහි කරල තියෙනවා. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ එක්තරා ශිෂ්‍යයෙක් ලලිත කලා අංශයේ නාට්‍ය කලාව පිළිබඳව විශේෂ උපාධියක් කළා. ඔහු ලියුව උපාධි නිබන්ධනයක් උඩරට නැටුම පිළිබඳ සංඥාර්ථවේදාත්මක අධ්‍යනයක්. ඒ දවස් වල 1999 / 2000 කාලය වන විට. ඒ සමඟම ඔහු එයට ඇතුලත් කලා CD එකකුත්. මං හිතන්නේ අපේ විශ්වවිද්‍යාලයේ පළමුවෙනි වරට CD එකක් ඇතුලත් කොට නිබන්ධනයක් ලියූ අවස්ථා. විභාග පරීක්‍ෂණයේ පිළිතුරු ප්‍රතිඵල නිකුත් වීමටත්

පෙරදා ඔහු ඉල්ලුවා ස්විස්ටර්ලන්ත විශ්වවිද්‍යාලයක ශිෂ්‍යත්වයක්. ප්‍රතිඵල එන්නත් පෙර ඔහුට ශිෂ්‍යත්වය ලැබුණා පමණක් නෙවෙයි වහාම ඔහු ඒ සමඟම එහේ ගොස් ආපසු පැමිණියේ කලා උපාධියක් ශාත්‍රපති උපාධියකුත් නෙවෙයි, විද්‍යාපති උපාධියකුත් අරගෙන. මම ඔහු ලියූ පොතක මේ පිළිබඳව පසුව සඳහන් කලා. මේ වගේ උපාධිධාරීන් රටට කිසිම බයක් නැතුව කියන්න පුළුවන් 21 වන සියවසේ ඕනෑම විශ්වවිද්‍යාලයකින් බිහි කරන්න පුළුවන් වේවා කියල. මේ එක උදාහරණයක්. තව මේ වගේ බොහොමයක් තියෙනවා. මේ තත්වය අපි බොහෝ දෙනෙක් දන්නෙ නැහැ. අපෙත් එක වැරැද්දක් තියෙනව. අපිත් මේවා ගැන සාකච්ඡා කරනව අඩුයි. නමුත් අපේ රටේ පුද්ගලික අංශයටවත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටවත්, මේ ගැන කිසිම අවබෝධයක් නෑ. ඔවුන් කල්පනා කරන්නේ නවීකරණය ගැන. ඔවුන් කල්පනා කරන්නේ පරණ ටොයෝටා කාර් එකයි අලුත් ටොයොටා කාර් එකයි පෙන්නල ඒ මඟින් දක්වන නවීකරණය තමයි. එහෙම නෙවෙයි. අපේ රටේ විශ්වවිද්‍යාල වල අනෙක් හැම අංශයක් වගේම සෞන්දර්ය අධ්‍යයනයත් ඉදිරියට ගොස් තිබෙනවා.

අනිත් පැත්තෙන් මේකෙ තියෙන වාසිය තමයි දැන් අපි පේරාදෙනියෙදි අපි අපේ ශිෂ්‍යයන්ට නිර්දේශයන් පාඨමාලාවන් හැදෑරුවම ඒක අපට ගිහිල්ලා කතා කරන්න වෙනවා, ඉදිරිපත් කරන්න වෙනවා, සෙනෙට් සභාවට. ඒ සෙනෙට් සභාවේ තියෙනවා වෛද්‍ය, ඉංජිනේරු, සත්ව විද්‍යා, කෘෂිකර්ම, දන්ත වෛද්‍ය සායන මේ ඔක්කොම හැමතැනින්ම එන මහාචාර්යවරු ඒ සියලු දෙනාම ඒ ඒ අයගේ දෘෂ්ටි කෝණයන්ගෙන් අපගේ පාඨමාලාව විවේචන කරනවා. එකෙන් ඇත්තටම මා එම පේරාදෙනියේ ලලිත කලා අංශයේ අංශාධිපතිවරයා විදියට ලැබුව අත්දැකීම තමයි එම බලපෑම ඉතාම වැදගත්. තීරණාත්මකයි. අපි හුදකලා නොවීම. නමුත් මේක සමහර තැන්වල වෙන් නෑ, මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි තනි සෞන්දර්ය විද්‍යා විශ්වවිද්‍යාලයක් පිහිටු වීම ගැන.

ස්තුතියි

## සෞන්දර්ය අධ්‍යාපනයේ ගැටලු සහ එහි දිශානතීන්

### ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන

මූලාසනය ඇතුළු ඔබ සියලු දෙනාගෙන් අවසරයි.

මං හිතන්නෙ, අපේ විද්වතුන් ඔබට සෑහෙන දුරට යම්කිසි පැහැදිලි චිත්‍රයක ලකුණු හඳුන්වලා දුන්නා. එම ශ්‍රීපාලි මණ්ඩපය හා සම්බන්ධ ප්‍රශ්නයේ පැතිකඩවල් කිහිපයක්ම අපට නිරාවරණය වෙමින් පවතිනවා. එකක් ආචාර්ය අමරකීර්ති ඉතා මැනවින් ඔබට පෙන්වා දුන්නා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය හා සම්බන්ධව ගත්තාම සෞන්දර්යය අධ්‍යාපනයේ තියෙන සුවිශේෂීතාවත්. ඒ මොන මට්ටමින් පවත්වා ගන්නට ඕනද? කියන එක පිළිබඳව. ජාත්‍යන්තර වශයෙන් විශ්වවිද්‍යාල සම්ප්‍රදායන් තුළ මේ මානව සෞන්දර්යය අධ්‍යාපනය කොහොමද පිහිටවලා තියෙන්නේ කියන ඒව පිළිබඳව. දැන් මම මගේ මාතෘකාව එතනට යොමුකරන්න කැමතියි. මෙතෙක් අප කතා කරපු දේවල්වල තවත් යටිතලය පැත්තක්, ගැඹුරක් තියෙනවා. අපේ සමාජයට බැහැල අපේ පාසල් අධ්‍යාපනයේ ඉඳල සෞන්දර්යය අධ්‍යාපනය අපි කොහොමද කල්පනාකරල තියෙන්නේ කියන එක පිළිබඳව හිතන්න ඕන. ඒක විශ්වවිද්‍යාල දක්වා එනකොට මොනවගේ අභියෝග සහ ගැටලු වලටද මුහුණ පාන්නේ. ශ්‍රීපාලිය ඒ ගැටලු මැද්දේ ගත්ත දිශානතිය කොයි වගේ ද කියන එක ගැන යම්කිසි හැඳින්වීමක් කරන්නටයි මම බලාපොරොත්තු වෙන්නේ. නමුත් අර කරුණු මම හිතන්නෙ මගහැරල යන්නට මා කැමති නැහැ. ඔය High bridge කතාව. දැන් සාමාන්‍යයෙන් මම, ඇත්ත වශයෙන්ම මම මගේ Academic නැත්නම් ශාස්ත්‍රාලිය පැත්තෙන්, මගේ පුහුණුව තියෙන්නේ ඔය High bridge පැත්ත තමයි. ප්‍රවීණ විද්‍යාඥයෙක් මම මගේ පුහුණුවෙන්. ශාක ප්‍රවීන විද්‍යාව තමයි මගේ ආචාර්යය උපාධිය. ඒ නිසා මට වගකීමෙන් කියන්න පුළුවන් ඔය High bridge නැත්නම් අන්තර් පරාගනයෙන් සම්බන්ධ වෙන්න පුළුවන් ජීව පද්ධතීන් 2 ක් අතර සම්බන්ධය විවිධ ප්‍රතිඵල ගෙනත් දෙන්න පුළුවන්. එකම ප්‍රතිඵලය නොවේ. ඉතාම විශිෂ්ඨ ප්‍රතිඵල එන්න පුළුවන් අවස්ථාත් තියෙනවා. කිසිම ප්‍රයෝජනයක් නැති සහ ඉතාම දරුණු ප්‍රතිඵල එන්න පුළුවන් අවස්ථාත් ඉතාම බහුලයි. කලාතුරකින් තමයි, කලාතුරකින් කියන්නත් බැහැ. යම්කිසි ප්‍රතිඵල එනවා. ඉතින් ප්‍රවීණ විද්‍යාඥයෝ ඒවා තෝරලා බේරලා හොඳ දේ තෝරා ගන්නවා. බහුතරයක් වැඩකට නැති දේවල් අයින් කරනවා.

මේ කාරණය මතක් වුනේ අර අමරකීර්ති ආචාර්ය තුමා ඔය කිවුවා වගේ ඔය තියෙන්නෙ ජීව විද්‍යාත්මක High bridge සංකල්පයවත් නෙවෙයි. ඒකයි ප්‍රශ්නේ තියෙන්නේ. ඒක බෙහොම Mechanical නැත්නම් යාන්ත්‍රික යන්ත්‍ර 2 ක කොටස් 2 ක් එකතු කරලා අලුත් එකක් හැදීමේ සංකල්පයක් තියෙන්නේ. ඒක High bridge සංකල්පය නොවෙයි. ඒක වෙන මොකක්ද එකක්. ඒ නිසා ඒක අපි කල්පනා කරන්න ඕන.

දැන් ශාස්ත්‍රාලයීය වශයෙන් අපි යම් කිසි ශාස්ත්‍රාලයීය ධාරා 2 ක් කිසියම් තත්වයන් ඇතුලේ සම්බන්ධ කරනකොට හොඳ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්. හැබැයි මං හිතන්නෙ ඒ වැදගත් තත්වයක් ගැන ඉතාම පැහැදිලි ඉඟියක් මහාචාර්යය මයිකල් අපිට ඉදිරිපත් කළා. මොකක් ද තත්වය. දැන් මේක සමාන්තර සමාන ජීව පද්ධතීන් 2 ක එකතුවක් නොවෙයි මේ වෙන්න යන්නේ. අපි උපමා රූපක පාවිච්චි කරලා කිවුවොත් මකරෙක් රාජාලියෙක් ගිලිනවා වගේ වැඩක්. ඊට පස්සෙ රාජාලිය නෑ. එච්චරයි වෙන්නෙ. ඒක ගිලීමක්. ඒ ගිල්ලයින් පස්සේ මුකුත්ම ඉතුරු වෙන්නේ නෑ. ඒක High bridge නෙවෙයි. ඇයි ගිලින්නේ නැත්නම් කොහොමද ගිලෙන්නේ. මේ පරිපාලන ක්‍රමය, කලමනාකරන ක්‍රමය ඒක විශාලයි, එය ශ්‍රීපාලියට වඩා විශාල ආයතනයක්. යම්කිසි දුරට සම්ප්‍රදායානු කූලව ස්ථාපනය වෙච්ච එකක්. එතකොට මෙතන ජීවනාත්මක ගනුදෙනුවක් නෙමේ සිද්ධ වෙන්නේ. මෙන්න මේකයි තියෙන අනතුර. ඒ තරමටම ශ්‍රාස්ත්‍රාලීය දිශානතීන් දෙකේ පාහන්නට බැරි තැනක් තියෙනවා ඒක තමයි මගේ මාතෘකාවට ටිකක් සම්බන්ධ වෙන්නේ.

අපි බලන්න ඕන අවුරුදු ගණනාවක අපේ විද්වත්තු විදිහට සමාජය දිහා බලනකොට ලංකාවේ සෞන්දර්ය අධ්‍යාපනය, සෞන්දර්ය වින්දනය අපේ සමාජයේ කොහොමද පවතින්නේ කියලා. අපි ටිකක් විචාරාත්මකව, ස්වයං විවේචනාත්මකව, තුලනාත්මකව අනෙක් රටවල් එක්ක කල්පනාකර බලන්න වටිනා දෙයක්. ඒ සම්බන්ධව විශාල ගැටලු තියෙනවා කියන එකයි මගේ මතය.

කෙටියෙන් අදහස් කරණ කොට, පුරවැසි මංපෙත් පොතේ, කවුරුහරි කීවොත් ඔබට බලන්න පුළුවන් ශ්‍රී ලංකාවේ නැත්නම් අපි, සිංහල සමාජය, විශේෂයෙන්ම කලාව සම්බන්ධයෙන් දක්වන අසිරු සම්බන්ධය පිළිබඳ කොටසක් මම ලියල තියෙනව. අපේ කලාවත් එක්ක සමාජයත් එක්ක අපි දක්වන සම්බන්ධය ගැටලු සහගතයි

කියන එක. අන්න එතනදි තමයි මේ ප්‍රශ්නය පටන් ගන්න ඕන. විශේෂයෙන් දෘශ්‍ය කලාවන් සහ අති විශේෂ වශයෙන් ප්‍රාසංග කලාවන් සමග අපේ සම්බන්ධය හුඟක් නරකයි. අපි බොහොම කලාවට ආදරය කරන උදවිය කියල කිව්වට ඇත්තවශයෙන්, සාමාජිකවශයෙන්, ආයතනික හා රාජ්‍ය වශයෙන් බලපුවම අපේ සම්බන්ධය පෙන්නන්නෙ නෑ. අපි කලාවට ආදරය කරන මිනිස්සු විදිහට, අපි කලාවට වියදම් කරන්න කැමති නෑ. රජයක් විදිහට, සමාජයක් විදිහට අපි ඊට වඩා ක්‍රිකට් වලට වියදම් කරනවා. ලංකාවේ අමාත්‍යාංශ අතරින් දුප්පත්ම අමාත්‍යාංශය සංස්කෘතික අමාත්‍යාංශය. අපේ ජාතික අයවැයෙන් 0.3% වත් සංස්කෘතික අමාත්‍යාංශයට වෙන් වෙන්නෙ නෑ. ඒකෙනුත්, ඉතා වැදගත් දෙපාත්තුමේන්තු තියෙනවා සංස්කෘතික අමාත්‍යාංශයේ පුරාවිද්‍යා දෙපාත්තුමේන්තු වගේ. ඒවට මුදල් ගියායින් පස්සෙ කලා සංස්කෘතික කලා ජීවිතය හා කලා නිශ්පාදන සඳහා සත පහක මුදලක් කලා ක්ෂේත්‍රයට ලැබෙන්නෙ නෑ. ඒ නිසා ලංකාව මා දන්නා තරමින් ඔය දියුණු ප්‍රබුද්ධ රටවල් අතරින් කලා නිෂ්පාදන සඳහා මහජන අරමුදල් සම්පාදනය නොකරන රටක්. අපි ක්‍රිකට් වලට වියදම් කරනවා. අපි කලාවට වියදම් කරන්නේ නෑ.

දැන් කලා අධ්‍යාපනය, විශේෂයෙන් සෞන්දර්ය අධ්‍යාපනය කියල අප නම් කරනදේ, මේ පාසල් අධ්‍යාපනය බලද්දි අවුරුදු 60 ක් තිස්සේ ලලිත කලාවන් නමින් විෂයන් 3ක් අපි පාසල්වල උගන්නල තියෙනවා. සංගීතය, නර්තනය සහ චිත්‍ර කලා. මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාවලින්, ගුරු පුහුණු ක්‍රම, ගුරු පුහුණු ආකාර, ගුරු පුහුණු ආයතන, ගුරු පුහුනු අත්පොත් සහ ඒවට අයිති යම්කිසි සෞන්දර්යාත්මක විෂයධාරාවන් නිර්මාණය වෙලා තියෙනව පසු ගිය අවුරුදු 60 ක කාලය තුළ. දැන් මේව පරීක්ෂාවෙන් බලද්දි නර්තනය සංගීතය වගේ විශයන්, අධ්‍යාපනයේ සෞන්දර්ය පදනම, වැඩිය සැහැල්ලු, නැත්නම් සැර වචන පාවිච්චි නොකලොත් ඒකට කියන්න තියෙන්නෙ හුඟක් පරණයි කියලා. ඒක ශාස්ත්‍රිය වශයෙන් කීවොත් අපිට කියන්න පුළුවන් වැඩවසම් ආවිර්ණකල්පික සෞන්දර්ය පදනම තමයි. විශේෂයෙන් නර්තනය සංගිතය සම්බන්ධයෙන් අපේ පාසල් අධ්‍යාපනය පදනම් වෙලා තියෙන්නේ, රාමුව තියෙන්නේ, සෞන්දර්ය රාමුව අපි බලන විදිහ අපිට නර්තනය මොකටද කියල ඇහුවොත් මං හිතන්නේ නෑ හොඳ උත්තරයක් නර්තන ගුරුවරියකට දෙන්න පුළුවන් කියලා. පොතේ තියෙනව දේවල්. හැබැයි කිසිම දවසක ඔබට ඇහෙන්නේ නැති වෙයි මේ ප්‍රකාශය. මොකද්ද?

නර්තනය කියන්නේ අපේ ජීවිතය ප්‍රකාශ කරන්න තියෙන ඉතාම විශිෂ්ඨ අමුතු විදිහක්. මේක ජීවිතය ප්‍රකාශ කරන්න තියෙන ආකාරයක් කියන කතාව ඔබට ඇහෙන එකක් නෑ. සංගීතය සම්බන්ධයෙනුත් ඒකමයි තියෙන්නේ.

අපිට ඇවිල්ල තියන ඒ සෞන්දර්ය පදනම 18 වන ශතවර්ශයේ ලලිත කලා පිළිබඳව ප්‍රංශයේ ඒ කාලයේ ප්‍රභූන් අතරින් ඇතිවෙච්ච Fine Arts සියුම් කලාව. පොළවෙන් උඩ අමුතු පිරිසක, අපි ප්‍රභූන්ගේ කලාවන් පිළිබඳව අදහසක් එක්ක තමයි අපි මූලික වශයෙන් ඔය සංකල්පනය ඉදිරිපත් කරගෙන තියෙන්නෙ. එතකොට, පොළවට අපේ සම්බන්ධයක් නෑ. නමුත් නූතන සෞන්දර්ය පදනම අවුරුදු එක්දහස් අටසිය ගනන්, එක්දාස් හත්සිය ගනන් මෙහාට වර්ධනය වන ආකාරය බැලුවොත් අපිට පෙනෙන්නෙ නූතන සෞන්දර්ය පදනම කියල කියන්නෙ ප්‍රථම කොට මේ මනුෂ්‍ය සමාජ ජීවිතයේ පොළවට ආබද්ධ කරන්න වෙන්න වෙච්ච එහි ප්‍රකාශනය හා සම්බන්ධ මාධ්‍යයන් වශයෙන්. නර්තනය වේවා, සංගීතය වේවා, චිත්‍ර කලාව වේවා. බොහෝ වෙලාවලට මේ රටවල චිත්‍ර කලාව තමයි ප්‍රමුඛත්වයට පෙරගාමී උනේ. එතකොට මේ පෙරලිය අවු 150 කට 200 කට කලින් යුරෝපයේ ඇතිවෙන්න පටන් අරන්, ඉන්දියාවේ අපිට පැහැදිලිව කියන්න පුළුවන් කල්කටාව ආශ්‍රිත වෙච්ච පුනරුදය වංග තුළ අවු 150 ක විතර කාලයක් තිස්සේ මේ සෞන්දර්ය පෙරලිය, සෞන්දර්ය චින්තාවේ පෙරලිය, ඒ රටවල සිද්ධ උනා. නර්තනය සම්බන්ධයෙන් හෝ සංගීතය සම්බන්ධයෙන් හෝ චිත්‍ර කලාව සම්බන්ධයෙන් හෝ මේ පෙරලිය මේ ආකාරයෙන් මෙහෙ උනේ නෑ. චිත්‍රකලාව සම්බන්ධයෙන් යම් විශේෂතා තියෙනවා.

අද තියෙන සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ආරම්භක චිත්‍ර කලා අංශයේ උරුමය දිහා බැලුවත් ඒ විශේෂකම් තියෙනවා. අපිට 43 නේ කණ්ඩායමක් හිටියා, ඒගොල්ලො නූතනවාදීන් එතකොට ඒගොල්ලො 1940 ගණන් විතර මෙපිටට හිතන්න පටන් ගත්ත. දැන් නර්තනය සම්බන්ධයෙන් යමක් කියන්න පුළුවන් තිස් ගනන්වල, 1934 තමයි තුන් වන වරට තාගෝර් ලංකාවට පැමිණියේ. ඇවිල්ල ඔය සුවිශේෂ බිම, ශ්‍රී පාලියේ විල්මට් ඒ පෙරේරා මහත්මයාගේ අනුග්‍රහයෙන්, මම හිතන්නෙ ඒක තමයි ලංකාවෙ එකම ස්ථානය ඉඩම් හිමියෙක් සෞන්දර්ය කලා කටයුත්තක් සඳහා ආයතනයක් සඳහා ඉඩම් පිරිනමල, යම්කිසි මුදලක් වෙන් කරල තියෙන්නේ. ඇත්ත වශයෙන්ම මෙය අපේ සම්ප්‍රදායට අනුව කරපු එකක් නෙමෙයි. මෙය

ඉන්දියාවේ වංග පුනරුද සම්ප්‍රදායට අනුව කරපු හිතීමක් තමයි ඔය විල්මට් ඒ පෙරේරා මහත්තයා ශ්‍රීපාලි භූමිය පරිත්‍යාග කිරීම. තාගෝර් ඇවිල්ල ඔතන මුල් ගලක් තිබ්බ. ඒ නිසා විශිෂ්ඨ අපේ ඉතිහාසයේ උරුමයක් බවට පත්වුනා. අපත් බෙංගාල පුනරුදයන් අතර සම්බන්ධය අපට මතක් කරන තැන ශ්‍රී පාලිය.

ශ්‍රීපාලිය මේ ආයතනය පිහිටෙව්වා. 1934 ආපු වෙලාවෙ තාගෝර් තමන්ගේ ශාප් මෝචන් නාට්‍ය සහ තවත් නාට්‍යයක දර්ශන දෙක තුනක් පැවැත්තුවා. ඒ දර්ශන දැක්ක දහතුන් වියේ හිටපු සීබට් ඩයස්ගෙ පුතා, මොරිස් ඩයස් තවත් තරුණ නැත්නම් යොවුන් ළමයි කිප දෙනෙක් ඒ දර්ශන දැක්ක. දැකල හිතන්න බැරි තරම් ආශ්වාදයට පත්වෙලා මොවුන්ට ඕනකමක් තිබුන, තදබල අවශ්‍යතාවක් තිබුන, ඉන්දියාවට යන්න. විශේෂයෙන්ම ශාන්ති නිකේතනයට යන්න. ඒ ශාන්ති නිකේතනයට ගියාට පස්සෙන් පහු වෙලා කීහිප වතාවක් හිතෙනවා සෑහෙන කාලයක් ඉන්න. එතකොට චිත්‍රසේන, ඔහු චිත්‍රසේන ඩයස් ශාන්ති නිකේතනයට ගියා. ගිහිල්ල ඉගෙන ගෙන, දැන් එතන හුඟාක් දේවල් තියෙනව කියන්න දැන් මේ තාගෝර් ගැන. චිත්‍රසේන මොනවට ද විවෘත උනේ? චිත්‍රසේන මොනවද දැක්කෙ? මොනවටද සහභාගි උනේ? දිග කතාවක් මෙතන තියෙනවා. ඒ නව සෞන්දර්ය චින්තාව රැගෙන මේ නර්තනය හදාරපු තරුණයො ලංකාවට එනවා. ලංකාවෙ නර්තනයත් ඔවුන් හැදෑරුව. ඊට කලිනුත් ඔවුන් හදාරල තිබුන. නමුත් මේ හිතීම වෙනස් වෙන්න පටන් ගත්තා. සාම්ප්‍රදායික නර්තනයේ තිබ්ච්ච සීමාවෙන් කැඩිල හිතන්න පටන්ගත්ත. අර ප්‍රධාන ප්‍රශ්නය ආව. තාගෝර්ලා කරපු වැඩවල තිබ්ච්ච ප්‍රශ්නය ආව. මොකටද මේ කලාව කියන ප්‍රශ්නය. මොකටද ප්‍රාසංග කලා. මේ දැන් තියන ජීවිතේ ප්‍රකාශකරන්න බැරිනම් ඒක මළ ගිය කලාවක්. ඒකයි ඔහු ඉගෙනගෙන ආපු දේ. ඔවුන් ලංකාවට ඇවිල්ල අලුත් නර්තන භාෂාවක් සොයන්න ඇත්ත වශයෙන් සිද්ධ උනා. මොකද හැරිල බලනකොට අපේ තිබ්ච්ච සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රකාශන ශක්තින් හීන බව නැත්නම් ප්‍රකාශන ශක්තිය තිබ්ච්ච යම්කිසි හැකියාවන් මැකිල සෝදා පාලු වෙලා. අපිට ඉතිරිවෙලා තියෙන්නේ නිකම් නෂ්ටාවශේෂ සම්ප්‍රදායන් කියල මේ තරුණයින්ට තේරුණා. මේක බැඳල තියාගන්නට නෙවෙයි අපි ඉගන ගන්න ඕන. යම්කිසි මෙවලම් හැටියට අලුත් නර්තන භාෂාව සහ අලුත් දේවල් සඳහා පාවිච්චි කරන්න මූලද්‍රව්‍ය අමුද්‍රව්‍ය විදිහට පවත්ව ගන්න ඕන. දැන් මේව වෙනම කෞතුක භාණ්ඩ විදිහට සංරක්ෂණය කිරීමේ ප්‍රශ්නය තියෙනවා. ඕනම රටක් කරනවා. කරන ඒව

බොහොම නිර්මාණශීලි විදිහට සංරක්ෂණය කරනවා. හැබැයි ඒක එක වැඩක් සෞන්දර්ය ක්ෂේත්‍රයේ. එකම වැදගත්ම වැඩේ ඒක නෙවෙයි. ඒක රකින්නත් ඕන අර වැදගත්ම වැඩේ සඳහා. මොකටද අධ්‍යාත්මික ජීවිතය, සමකාලීන ජීවිතය, ප්‍රබලව නැවත ජනතාව සමග බෙදාගන්න. නැත්නම් ප්‍රකාශ කිරීම සඳහා. එතකොට චිත්‍රසේන ලංකාවට ඇවිල්ල මොනවද කලේ. කරදිය. නළදමයන්ති. කිංකිනි කෝළම. ශිව රංග. අපි මේ වගේ යම්කිසි සෞන්දර්ය පදනම හොයල බැලුවොත් ඔබට පෙනෙයි මේවායේ තියෙනවා සමාජයක් විදිහට එවකට දැකපු තමන් බිහිවෙච්ච තමන් අත්දුටු වෙරළබඩ ජීවිතය, සමාජ ජීවිතය. මේවත් එක්ක හැල හැප්පීම්. කැපුම්. කොහොමද නර්තනයෙන් ප්‍රකාශ කරන්නේ. මෙන්න මේව චිත්‍රසේන හිතුවෙ. කිංකිනි කෝළමේ තියෙන අපේ සම්ප්‍රදායික වැඩවසම් සමාජයේ පීඩාව පරිපීඩාව සහ ඒ චරිත, ශිවරංග නර්තනයේ තිබෙන්නේ ඉතාම ගැඹුරු ආගමික දාර්ශනික දේවල් අධ්‍යාත්මික මිම් පිළිබඳ කරුණු. ඒව හුදෙක් ප්‍රකාශ රහිත දේවල් නෙවෙයි. දැන් මෙන්න මේ වගේ අලුත් වැඩ නැත්නම් නූතන ආකාරයට මේ නර්තනය සම්බන්ධයෙන් ප්‍රකාශනයක් ලංකවේ එන්න පටන් ගත්තා පනහ හැට දශකවල. දැන් මේ නව සෞන්දර්යය, සිතීමෙන් අංශු මාත්‍රයක් අපේ පාසල් වලට ගියද? අපේ Syllabus වලට ගියාද? අපේ ගුරුවරුන්ගේ ඔලු තුළට ගියාද? අපේ ඇඟට ගියාද? එක බින්දුවක් ගියේ නෑ. ඔන්න ඔක තමයි ප්‍රශ්නේ.

විශ්වවිද්‍යාලයේ සෞන්දර්යය මොනවටද සම්බන්ධ, සෞන්දර්ය කියල කියනකොට සෞන්දර්ය චින්තාව කියන එක මේ නිකන් අහසේ තියෙන දෙයක් නෙවෙයි. අපි ශාස්ත්‍රාලයීය වශයෙන් බැලුවොත්, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, මානව විද්‍යාව, මනෝ විද්‍යාව මේ වගේ අනෙකුත් මනුෂ්‍යයාගේ ජීවිතය අධ්‍යයනය කරන විද්‍යාවන් රහිතව, ඒවාහි ආශ්‍රයක් නැතිව ගැඹුරු සෞන්දර්ය ප්‍රවේශයන් බිහි කරන්න බැහැ.

ඇත්ත වශයෙන් අපි හරියට කල්පනා කලොත්, අපිට ශ්‍රීපාලියේ අනාගතය සම්බන්ධයෙන් අපි පලකරන්න ඕන දේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගළවන්න කියන එක නෙවෙයි. කොළඹ විශ්වවිද්‍යාලයේ අනෙක් සම්පත් අපිට එකතු කරන්න කියන එකයි. මොකද, සමාජ විද්‍යා අංශය තියෙනවා කොළඹ විශ්වවිද්‍යාලයේ. ඉතිහාසය අංශයක් තියෙනවා. දැන් මේ වායේ සංපර්කය තව දියුනු කරන්න පුළුවන්දැයි

කියල බලන්න ඕන. අයින් කරන එක නෙවෙයි. ගළවන්න බැහැ. ගලවනවා කියන්නේ අර කලායතනයක පරණ වැඩේ කරනවානම් අපිට එහෙම හිතන්න පුළුවන්. නමුත් කොළඹ විශ්වවිද්‍යාලයට මම හිතන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා ශ්‍රීපාලිය අවශ්‍ය වෙනවා වගේම ශ්‍රීපාලියට කොළඹ විශ්වවිද්‍යාලයට අදාළ මම කියපු අනෙකුත් මානව ශාස්ත්‍ර අංශයන් පිළිබඳව අදාළ විද්‍යාවන්හි ආශ්‍රය අපිට අවශ්‍යයි. මේක මං මේ කියන්නේ, එකක් අපේ දරුවො දන්නවා, ශ්‍රීපාලි මණ්ඩපයේ ඉගෙනගන්න ප්‍රාසංග කලා හදාරන අය, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවම වශයෙන් මට මතක විදියට Units 6 ක් 7ක් විතර තියෙනවා සමාජ විද්‍යාවට, මානව විද්‍යාවට වෙනත් දර්ශනයට විචාර විද්‍යාවන්ට සම්බන්ධව. මං හිතන්නේ අපේ විශ්වවිද්‍යාලයේ අපේ මණ්ඩපයේ පමණයි සංස්කෘතික මානව විද්‍යාව කියල විෂයක් සෞන්දර්ය හදාරන නැත්නම් ප්‍රසංග කලාව හදාරන දරුවන්ට උගන්වන්නේ. අපේ තියෙනවා විෂයක් කලා ප්‍රවනතාවන් පසුබිමේ නැත්නම් (Social Dynamics behind the Arts Trends) කලා ප්‍රවණතාවන් පසුබිමේ සමාජ ගතිකයන් කියල. ඊට පස්සේ කෙලින්ම සමාජ විද්‍යාත්මක, දේශපාලන විද්‍යාත්මක විමර්ශන සඳහා ඇරිච්ච Unit එකක්. දැනට ශ්‍රී පාලි මණ්ඩපයේ විතරයි තමන්ගෙ Syllabus එක ඇතුළට මේ වගේ විචාරාත්මක, සමාජයට සම්බන්ධ වෙච්ච දේවල් ඉදිරිපත් කරගෙන යන්නේ. මම මේ කාරනය කියන්න ගියේ මට තව දේවල් මතක් වෙච්ච නිසා. විශ්වවිද්‍යාලයෙන් ඇත්තටම නැට්ටුවො බිහි කරන්න බෑ. එකත් මතක තියා ගන්න ඕන. පදනමක් දන්න පුළුවන්. ගිහිල්ල වෙනමම ඉගෙනගන්න ඕන නැටුම් ගුරුවරුන්ගෙන්. අවුරුදු 4 කින් නැට්ටුවෙක් බිහිකරන්න බෑ. උදාහරණයක් මම කියන්නම්.

ටිකක් විදේශික පිරිසකුත් ඉන්න තැන තවත් වෙනත් වෙනත් දේවල් සිද්ද වුනා. මම ඔහුගේ නම කියන්නේ නැහැ. දක්ෂ ශිෂ්‍යයෙක් වෙන්න ඕනෙ. හැබැයි ඔලුවට තමන් මේ මොනවද කරන්නෙ කියලවත් ඔහු දන්නෙ නැති බවයි මට හිතුනෙ. මේක මං කියන්නම්. මම නම කීම අවශ්‍යය නැහැ. එයා ටිකක් මම හිතන්නෙ ටුවරිස් බිස්නස් එකේ ඉන්නෙ. ඒගොල්ලො තමයි මේව කරන්නෙ. මේ ගෑණු ළමයි මං හිතන්නෙ ඔයගොල්ලො දන්නව ............ගේ දිගානතිය. සම්පූර්ණ මේ ටුවරිස් බිස්නස් එකක් එක්ක යන වැඩක්. ඒ වැඩ කල හැකියි කල යුතුයි. ඒව විශ්වවිද්‍යාල වැඩද කියන එකයි ප්‍රශ්නෙ. මේ ගැහැණු ළමයින්ට ඉතින්

භාගෙට අන්දල, මේ නර්තන අංග තුනක් ඉදිරිපත් කළා. එකක් කුළු නැටුමක්, එකක් සෙමෙර නැටුමක් තවත් සාමාන්‍ය සම්ප්‍රදායික උඩරට නැටුමකට ආශ්‍රිත නැටුමක්. දැන් අර පිරිස ඉදිරියේ මේක ඉදිරිපත් කළා. කරල කතා කරා. කතා කරල කිව්ව. මේක ලංකාවේ පළාත් වලින් ඒ සාම්ප්‍රදායික Folk Dance නැත්නම් ජන නර්තනය දිගටම පවත්වාගෙන යන්න කියලා. අපේ පෙර සිට පැවත එන, අපි බොහොම ගරු කරන, ජන නර්තන එහෙම නැත්නම් Folk Dance කියල තමයි ඔහු මේ නර්තන කාණ්ඩ තුන හැඳින්නුවේ. දැන් මේ තරුණය දන්නෙ නැහැ ලංකාවෙ ජන නැටුමෙ ප්‍රභවය නැත්නම් සම්භවය, විකාශය පිළිබඳව කිසිම දෙයක්. ඔය කියන ගොයම් නැටුම, කුළු නැටුම, ආදියෙහි බිහිවීම මං හිතන්නෙ අවු 60 කට වඩා නැහැ. මේවා පනිභාරත කියන මහත්තයත් තව දෙතුන් දෙනෙක් අර රැජිණ ආපු වෙලේ පෙන්නන්න හදපු නැටුම්. ඕව එහෙන් මෙහෙන් අහුලගෙන එකතු කරල ගොඩ නැගුවා. ඊට පස්සෙ 60 ගනන් වල මාලගම්මන කියල සර් කෙනෙක් හිටියා. මම හොඳින් දන්න නිසා කියන්නෙ. අර කුළු නැටුමට තව ටිකක් පොඩි වර්ධනයක් දුන්නා. ඒක බොහොම ජව සම්පන්න කුළු නැටුමක්. ඊට පස්සෙ මේ කුළු නැටුම් මුළු රට පුරාම ගියා. අන්න ඒක ගියා පාසල් අධ්‍යාපනයට, මේ කුළු නැටුම ජන නැටුම (Folk Dance). 1960 ගනන්වල කිව්වම කොච්චරද මේ නැටුම් වලට වයස. අවු 50 ක් වත් නෑ. දැන් ඒව ජන නැටුම් කියල කියන එක ප්‍රශ්නයක්. අපි පාසල් වල ඕව නටනව. නමුත් අපේ පැරණි ගැමි ජනතාව තුළ ඔහොම ජන නැටුම් නටන්න අවකාශයක්වත් තිබුනෙ නෑ. අපිට තිබුන වෙන නර්තන ශාන්තිකර්ම, බලි තොවිල් වගේ නොයෙකුත් දේවල්. හැබැයි මෙහෙම අවකාශයක් අපේ පැරණි ගමේ තිබුනෙ නැහැ. මිනිස්සු වාඩිවෙලා ජන නැටුම් බලපු අවකාශයක් තිබුනෙ නැහැ. ඒක බොරු. ඒක මිත්‍යාවක් දැන් මේ කරපු දේවත් දන්නෙ නැති ප්‍රශ්නයක්නෙ මෙතන තියෙන්නෙ. එතකොට ඔන්න මේ වායේ මානව විද්‍යාත්මක පැති අපට අවශ්‍යයි. මේ සමාජ විද්‍යාවත් අවශ්‍යයි. මේ සම්බන්ධය තේරුම් ගැනීමට අපට අවශ්‍ය වෙනව.

දැන් එවැනි දිගානතියක් තමයි ශ්‍රීපාලි මණ්ඩපය ගත්තෙ. ශ්‍රීපාලි මණ්ඩපයේ දිගානතින් තව තියෙනවා. විශ්වවිද්‍යාලවල නර්තනය හා නාට්‍ය අංග තියෙනවා. සබරගමු උඩරට මේ ආදී අංග. ඒවායින් බිහිවන්නේ කවුද? උඩරට නැට්ටුවො ද? සබරගමු නැට්ටුවො ද? ඒ ගොල්ලො කොහොමද යන්නෙ? මොනවද නටන්නෙ?

ඒගොල්ලො Tourist Industry එකට යනවනම් හරි. අපේ සංචාරක කර්මාන්තයටත් ශාස්ත්‍රීය අරමුණු නෑ.

දැන් අපි කල්පනා කරන කොට අපිට තේරුණා දැන් මෙහෙම වෙනම පුංචි සම්ප්‍රදායන් ගොඩනැගිගෙන එනකොට අද මේ සම්ප්‍රදායන් එකිනෙක මුණගැහෙන අවකාශය වැඩි වෙමින් පවතිනවා. අන්තර් සාම්ප්‍රදායික විලේයනය (Futions). ඒක කාටවත් නවත්තන්නත් බෑ. අන්තර් සාම්ප්‍රදායික, අන්තර් සංස්කෘතික හමුවීම, සම්මුඛ වීම තමයි අද දවසේ ලකුණ. දැන් හිතන්න ඕනෙ ඒ සම්ප්‍රදාය මොකක් ද කියලා. අපි කොහොමද මේව තේරුම් ගන්නෙ. අපි කොහොමද මේව උගන්වන්නෙ? ඊට අමතරව මාධ්‍ය පරිසරය සහ තාක්ෂණික පරිසරයක් තියෙනවා.

ඒක බලපෑම් කරනවා මේ ක්‍රියාවලින්ට. අපට අවශ්‍ය නර්තන ශිල්පින් ශිල්පිනියන් පමණක් වුනත් මේ තාක්ෂණය ගැන දන්නා කැමරාව ගැන දන්නා Lighting ගැන දන්නා ශිල්පින් අවශ්‍යය. අපි හිතමු කතක් නර්තනයක් කියලා, දැන් මේ කතක් නර්තනය විදග්ධ ප්‍රේක්ෂකයෙක් බලන විදියක් තියෙනවා. ඔහු හෝ ඇයගේ ඇස යන ආකාරයක් තියෙනවා. කොතනද ප්‍රබලතම ප්‍රකාශනය මේ මොහොතේ හිතෙන්නෙ කියලා ඒ ඇස දන්නවා. එහෙම දැනීමක් නොතිබෙන විට මනුෂ්‍යයෙක් කැමරාව පිටිපස්සට ආපුවාම මොන වගේ විකාරද වෙන්නෙ. අන්න ඒ වගේ විකාර තමයි අපි රූපවාහිනියෙ බලන්නේ. දත්ත අවශ්‍යයි දැනීමක් සම්පාදනය කරන්න මේ දෙක අතර. අපේ ප්‍රාසාංගික ශිල්පීන් දැනගන්න ඕන තාක්ෂණය. තාක්ෂණ ශිල්පීන් දැනගන්න ඕන මේ ප්‍රාසංගික ජිවිතයේ යම් මූලික දේවල්. දැන් මේ වගේ පැතිකඩවල් ගනනාවක් තියෙනවා අපේ ශ්‍රීපාලි මණ්ඩපය ගැන හිතද්දි.

අවසාන වශයෙන් මං කියන්නෙ. මගේ කාලය ඉවරයි. අවසාන වශයෙන්, මේක බැරෑරුම් මං කියන්නෙ පාසල් අධ්‍යාපනයේ දැවෙන ප්‍රශ්නයක්. ශ්‍රීපාලි මණ්ඩපය බොහොම සටන් කරල අති විශේෂ අභියෝගතා පරීක්ෂණය ක්‍රමයක් ගොඩ නැගුවා ශ්‍රීපාලි මණ්ඩපයට දරුවො ගනිද්දි. මේක අපට අවශ්‍ය වුනා. මේක නොකර බැරි වුනා. හැබැයි ඒක අමුතු එකක්. ඒකෙ බැලුවේ ඇග හැරෙන විදිහම විතරක්ම නෙවෙයි. මොළය නැත්නම් හිත, කල්පනාව වැඩ කරන විදියක් සහ දැනීම් අනෙකුත් වටපිටාව කොච්චර සංවේදී ද, හුරුබුහුටිද, මනස, මේවත් අපි මේ පරීක්ෂණයේදී අල්ලන්න බැලුවා. අපිට ඕන නර්තන ශිල්පින්, ඇඟ විතරක් නොවෙයි. මනස හුරුබුහුටිව වැඩක් කරන නර්තන ශිල්පින් ඕන කියන පදනමෙන්

ඉන්නවා. අපිට ගිය අවුරුද්දේ ඒක මැනවින් පෙනුනා. 1000 ක් විතර තරුණ දරුවෝ ඉල්ලල තිබුණා ශ්‍රීපාලි මණ්ඩපයට ඇතුල් වෙන්න. අවාසනාවට අපිට ගන්න පුළුවන් වුනේ 70 ක් වගේ පිරිසක්. ඒක තමයි තරඟය, අපට පැහැදිලිව පෙනුනා නර්තන විෂය සඳහා ඉල්ලලා ඉදිරිපත්වන දරුවො සහ සංගීතය සඳහා ඉල්ලල ඉදිරිපත් වන දර්ශන. සාපේක්ෂව, තුලනාත්මක බැලුවොත් අපි හිතමු චිත්‍ර කලා ධාරාවට නැත්නම් සිනමාවට විශේෂයෙන් ඉල්ලලා ඉදිරිපත්වන දරුවෝ අතර බරපතල වෙනසක් තියෙනවා සාමාන්‍ය සාමාජික දැනීමෙන්. අර නර්තනය හදාරන දරුවෝ සාමාන්‍යයෙන් පාසල් අධ්‍යාපනයෙන් එන දරුවො ඒ ගොල්ලො තමන්ගේ විෂය පුරෝගාමීන්වත් දන්නෑ. විශේෂයෙන්ම අර මං කිව්වෙ (Modern Acsthetics) චිත්‍රසේන කිව්වොත් චිත්‍ර අදින එක්කෙනෙක් කියල සමහර විට 90% කියයි. එහෙම අය වඩා විලම්බිත උත්තර තමයි කියන්නේ. සාමාන්‍ය දැනීමක් නෑ. ලොකු ගැටළුවක් තියෙනවා. ඒ අධ්‍යාපනයෙ කියන එකයි පේන්නේ. විශාල ගැටළුවක් තියෙනවා. යම් කිසි විදියකට සමාජයට යම්කිසි විවෘත භාවයක් අපිට ටිකක් පේනවා දෘශ්‍ය කලා ක්ෂේත්‍රයට අයිති පුහුණුවක් ලබා ගෙන එන ළමයි.

දැන් මේ වගේ කල්පනා කරන්න ඕන දේවල් තියෙනවා. බරපතළ ප්‍රශ්න තියෙනවා. දැන් මේවා මැද්දෙ තමයි අපේ ශ්‍රීපාලි අනාගතය හිතන්න ඕන. අවුරුදු 12ක් රටක් විදියට ජාතික වශයෙන් මේකට ආයෝජනයක් කරල තියෙනවා. මුදල් වශයෙන් ආයෝජනය කරල තියෙනවා. ඊට වඩා බරපතළව බුද්ධිමය වශයෙන්, අපේ හදවත් වශයෙන්.

මේ කාර්යයට සහභාගි වෙච්ච ගුරුවරු පිරිසක් මේකට විශාල තමන්ගේ ශක්තිය වැයකරල තියෙනවා. අවුරුදු 12 ක් මේක වැඩිල තියෙනවා. දැන් තමයි අපිට මේකේ ශක්තින්, ශක්‍යතාවන්, ප්‍රතිඵල යන්තම් පේන්න පටන්ගන්නේ. යන්තම් මල් පිපෙන්න හදන ගහ. දැන් මේ වෙලාවේ මේක මුලින් ගළවනව ද? නැද්ද? කියන එක මොන තරම් ජාතික අපරාදයක් ද කියන එකයි ප්‍රශ්නේ.

මේ කරුණු ඔබට කියලා මං හිතන්නේ මගේ කාලය හොදටම ඉවරයි. ඔබට ස්තුතියි.

# ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ඉවත් කිරීම ප්‍රතිපත්තිමය තිරණයක්ද?

ආචාර්ය ප්‍රභාත් ජයසිංහ

ශ්‍රීපාලිය මුහුණ පාලා තියෙන ගැටලු ගැන කතා කරන්න කරුණු කීපයක් මතු කළා. ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගළවා සෞන්දර්යට අනුබද්ධ කරන්න යනවා. කව්ද මේක කරන්නෙ. කමිටුවක් මඟින් කරලා නෑ. දන්නා තරමින් කමිටු පත් කරලා නෑ. තිරණ අරන් තියෙන්නෙ එක් පුද්ගලයෙක්. නායකත්ව පුහුණුවත් තිරණය කළේ එක්කෙනෙක් දෙන්නෙක්. පීඨ වල ශිෂ්‍ය ප්‍රමාණය වැඩි කරනවා. කවුද තීරණය කරන්නෙ, නවක වදය නැවැත්වීම පිළිබඳවත් තිරණ ගන්නෙ එක්කෙනෙක් දෙන්නෙක්.

කොහොමද තිරණය කරන්නෙ? මොන නිර්ණායක මතද? කොහොමද සෞන්දර්යට අනුබද්ධ කරන්නෙ? ශිෂ්‍ය පිරිස වැඩියි. භූමිය ශිෂ්‍යයෙක් නඩත්තු කිරීම මෙවැනි දේවල් සලකා බලන්න ඕනි. පාඨමාලාවල අනන්‍යතාවන් තියෙනවා. විශේෂ උපාධියේ විශේෂ කොටස් සමහර විශ්වවිද්‍යාල වල අවු 02යි. එක් එක් පීඨවලට අනන්‍යතා තියෙනවා. විෂය සංයුතිය වෙනස්. ශ්‍රීපාලියේ Curriculum එකේ අනන්‍යතාව කොහොමද?

ශ්‍රීපාලියේ අනන්‍යතාව නිර්ණායකයක් වෙන්නෙ නැද්ද මෙම තීරණය සඳහා. සෞන්දර්යෙදි අනන්‍යතාව වැඩියි. පිරිවැය අඩුකරන්න. උපාධිධාරියෙක්ගෙන් බලාපොරොත්තු වන දේ වෙනස්. නිර්ණායකයක් හදනවනම් පරිසරය බලපානවා. ශ්‍රීපාලියෙන් බිහිවෙන උපාධිධාරියා නෙමෙයි කොළඹින් බිහිවෙන්නෙ. ඊට වඩා වෙනස් පේරාදෙනියෙ පරිසරයෙන් බිහිවෙන උපාධිධාරියාගෙ ලක්ෂණ.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඇති අනන්‍යතාව වෙනස් එකකට බද්ධ කළොත් එහි අනන්‍යතාව වෙනස් වෙනවා. කොළඹ කලා පීඨයට ශ්‍රීපාලියෙන් ගන්න දේකුත් තියෙනවා. පිරිවැය ලාභය සම්බන්ධයෙන් ගන්න තිරණ මේ දින වල නිතරම සිදුකරනවා. උදාහරණ ලෙසට මහ බැංකු සේවකයන් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් අතර වෙනස. අදාල නිලධාරීන් කියන්නේ මහ බැංකුව ලාබ ලබන තැනක් නිසා ඔවුන්ට වැඩි වැටුප් ගෙවනවා කියල. විශ්වවිද්‍යාල ලාබ නොලබන නිසා අඩු වැටුප් ගෙවනවා. දැන් මෙය කලින් කතා

කළ දෙයට වඩා වෙනස් නොවේ. මානව සම්පත් යොදා ගෙන කරන ආයෝජනය කෙටි කාලීන නොවේ. මේක තමයි නිර්ණායකය අදාළ සම්පත් වෙනස් කරන. නිර්මාල් රංජිත් දේවසිරි මහතා කියන්නේ මෙය හරකා බෙදාගත්තා වගේ වැඩක් කියල. විශ්වවිද්‍යාලයේ අයට තියෙන්නේ හරකගෙ ඉස්සරහ. මහ බැංකුවට හරකගෙ පිටිපස්ස. එයාල තමයි ලාබ ලබන්නෙ.

මේක කොයිතරම් දුරට ගිහිල්ලද කීවොත් කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ අධිපතිගෙන් අහනවා Tourist Guide පුහුණු කරන පාඨමාලාවක් පටන්ගන්න බැරිද කියලා. මේක ඒ තරමටම දුරදිග ගිහිල්ල. ශ්‍රී පාලියෙන් ඇහුවොත් ඔයාලට බැරිද සංචාරකයින් පිනවන විනෝදකාමින් හදන්න කියල මොකක්ද කරන්නෙ.

දැන් මේ නිලධාරීන් තීරණ ගන්න ආකාරයයි. මේ නිසා තමයි, විශ්වවිද්‍යාල උඩට පත් කරන්නේ හිටපු විශ්වවිද්‍යාල ගුරුවරු. මේ මානය නිලධාරීන් තේරුම් ගත්තේ නැති නිසා උපකුලපති විශ්වවිද්‍යාල  ප්‍රතිපාදන කොමිසමේ සභාපති ලෙසට පත් කරන්නේ හිටපු ගුරුවරු. තත්ත්වය කණගාටුදායකයි. ඒ කට්ටිය නිලධාරීන්ට වඩා හපන්. අපි නිකන් හිතලා බැලුවහොත් දැන් බෙදපු පත්‍රිකාවේ උපුටා දක්වලා තියෙන ඒව. සෞන්දර්ය  විශ්වවිද්‍යාල උපකුලපති කියූ කරුණු සලකා බැලුවහොත් ඔහු සෑහෙන දේවල් වැරදියට කියා තියෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා චක්‍ර ලේඛනයක් නිකුත් කළා අංශාධිපතිවරු අස් වෙන කොට මාස 03කට කලින් දැනුම් දෙන්න ඕනෙ කියල. මෙහි කිසිම නෛතික පදනමක් නෑ. මේ ළඟදි පේරාදෙනියේ සම්මන්ත්‍රණයට ගියා. ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන්ගේ අතීතය මතකත් නෑ. ඛේදජනකයි.

මෙයාලා තීරණ ගන්න කොට අදාළ පරිපාලන වපසරිය අද කියන සමහර දෙයක් මෙයාලට මතක නෑ. ඊයෙ වෙනකන් පාලනය කළෙත් මෙයාලා කියලා ඇමතිවරයා හා බොහෝ අය අවඥාවෙන් කියන දෙයක් තමයි ලංකා විශ්වවිද්‍යාල වල ශ්‍රේණිගත කිරීම බොහොම පහළයි කියල. අපි හිතලා බැලුවහොත් පහළ තියෙන එකේ වගකීම ගුරුවරුන්ට ගන්න පුළුවන්. නමුත් ගන්නේ නෑ.

ශ්‍රීපාලිය සම්බන්ධයෙන් ගත්තොත් පිරිවැය වැනි ප්‍රශ්න වෙනකල් ඒ ගොල්ලෝ කොහෙද හිටියේ. මෙවැනි දෙයක් තියෙනවා නම් ඒ ගොල්ලෝ සන්නිවේදනය කරන විදිහ වැදගත් නෑ. පත්තරේ තිබ්බ දෙයක්. ඇමතිතුමා කියා තිබුණා ශ්‍රී පාලිය

අනිවාර්යෙන්ම සෞන්දර්යට අනුබද්ධ කරනව කියල. ඒ තීරණය බාර ගන්න බැරි කෙනෙක් ඉන්නවා නම් අස්වෙන්න පුළුවන්. මෙහෙමද වග කිවයුතු ඇමතිවරයෙක් සන්නිවේදනය කරන්නේ. පහුගිය කාලේ විශ්වවිද්‍යාල ගුරුවරුන්ට කළ මඩගැහිල්ල ගැන බැලුවොත් හිතා ගන්න බෑ. නමුත් අපි ඒ මඩ වලේ බහින්නේ නෑ. එහෙම කළොත් එතුමයි අපියි අතර වෙනසක් නෑ. පසුගිය දිනෙක 360 වැඩසටහනට ඇවිල්ලා විශ්වවිද්‍යාල ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි, NGO කාරයෙක් මේ වෙලාවේ ඔහු පිටරට ගිහින් ඉන්නෙත් මේ වගේ දේකට කියල. මෙය බරපතළ ප්‍රකාශනයක්. මෙය කියනවා නම් ඔහු සතුව සාක්ෂි තියෙන්න ඕනි.

නැතිනම් ඉතුරු ටික කියලා වැඩක් නෑ. මේක පළමු වතාව නෙවෙයි. කියන මේ ප්‍රකාශ සම්බන්ධයෙන් දැඩි නොකැමැත්ත, කළ කිරීම, අප්‍රසාදය පළ කරනවා. වගකිව යුතු අය මෙහෙම වැඩ කරන්න හොඳ නෑ. නිර්මාල් රංජිත්ගේ ජීවිතයට ඔහු වග කියනවාද? කිය්න අදහස් කළ කාරණා බැලුවම මෙයාලා තීරණ ගන්න විදිහ තීරණ ගන්න පාවිච්චි කරන නිර්ණායක හැමදේකටම එකයි. මට හිතෙන්නේ අපේ විශ්වවිද්‍යාල පද්ධතියක් හැටියට බල කරන්න ඕනි. මේ තත්ත්වය මඟ හරවා ගන්න. මේක ශ්‍රීපාලියට විතරක් වත් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. ටිකක් හිතලා බලන්න.

බොහොම ස්තුතියි!.

## චන්ද්‍රගුප්ත තේනුවර මහතා

හොරණ ශ්‍රීපාලි විශ්වවිද්‍යාල මණ්ඩපය සෞන්දර්ය විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කිරීම පිළිබඳව අපි එකහෙලාම විරුද්ධ විය යුතුයි. සමහර විට …………….. උපකුලපතිතුමා විශාල ආදරයක් මා කෙරේ දක්වන්න ඉඩ තියෙනවා අදින් පස්සේ. මම ඒ වගේ ආදරවලට ඉතිං සාමාන්‍යයෙන් අකමැති නෑ. මොකද, එතුමා ළඟ හොඳ අදහස් තියෙනවා සමහර වෙලාවලට. එතුමා මේ අර පියතුමෙක් වගේ හරිම ආදරයට ළමයට ඉගෙන ගන්න දෙන්නෙ නැති, නරක්වෙයි කියල කොහේක්වත් යවන්නැති නේද? පාර මාරු වෙන්න ඉඩදෙන් නැති, එහෙම ආදරය කරන තාත්තලත් ඉන්නවා. එහෙම තමයි මේ සෞන්දර්ය හදන්න යන්නේ. ඒ නිසා එතුමා ප්‍රමිතියක් හොඳ යෝජනාවක්, මම කිව්වා ඔව් ප්‍රමිති සෑදිය යුතුයි. ප්‍රමිති හදන්න ඕන අනෙක් අයගෙ නෙවෙයි. අපි ප්‍රමිතිය බවට පත්විය යුතුයි. අපි මෙහෙම දේවල් කරනවා. අපි මොස්කව් වල ඉගෙන ගන්න කොට අපි Lennin Institute එක ගැන තරඟයට හිතනවා. එහෙනම් ඉතින් සෝවියට් දේශයේ තියෙන ඇකඩමීස් 15 නෙවේ 17 විතර තිබුණා. ඉතිං එකම ඇකඩමියක්නෙ තියන්න තිබුණෙ. එහෙම තිබ්බේ නෑ. මොකද විවිධත්වය අවශ්‍යයි. ඒ තරම් හැමෝම ලේබල් කරපු, අර ඇමෙරිකන් කණ්ණාඩියෙන් බලලා නිදහස නෑ කියපු රටේ එහෙම නිදහසේ කලාව වර්ධනය වුණා. එහෙම වර්ධනය වෙන්න ඉඩකඩ තිබුණා. ඉතිං එහෙම වෙච්ච ඉතිහාසයක් තියෙන මේ සෞන්දර්ය.

අනික් එක හැමදාම වෙනස් විදිහකට ඉන්න හදන්නේ. එකම පංතියේ චිත්‍ර අදින කෙනා අනිත් එක්කෙනාට වඩා හැම වෙලේම වෙනස් වෙන්නයි හදන්නේ. එක වගේ වෙනවනම් කොපියක්නේ. සමහර වෙලාවට ඔය ප්‍රාසාංගික කලාවේ සමහර විට ඒ ගුණය තියෙන්න පුළුවන්. යම් කිසි පැරණි තනුවක් සංගීත බණ්ඩයක්, අලුත් කණ්ඩායමක් වෙනස් කරන්න පුළුවන්. හැබැයි ඒක නෙවේ වෙන්නේ. ඒකම නැතුව තමන්ගෙ ප්‍රකාශනයක් හැටියට කරන්න පුළුවන්, නමුත් චිත්‍ර කලාවේ නම් බොහෝ වෙලාවට කොපි කිරීම, විකිණීමට මිසක් තම නිර්මාණය සඳහා ඒක කරන්නෙ නෑ. ඒක නිසා හැම වෙලේම ඒ වෙනසක් සිතීම මොකක්හරි තේමාවක වුණත් එකම තේමාව දුන්නත් රජ්ජුරුවනගේ කාලේ මැඩෝනාවරු අඳින්න කිව්වම එකම අච්චුවේ නෙවේ ඒ ගොල්ලෝ ඇන්දේ. හැම වෙලේම සියුම් වෙනසක් හරි

කරන්න බැලුවා. ඉතිං එහෙම වෙනස් වෙන්න හදන බලන මේ අධ්‍යාපනය තුළදී මෙහෙම භූමි ද අල්ලගෙන එකක් කරන එක කවදාවත් සාර්ථක වෙන්නෙ නෑ.

අනිත් එක සම්පූර්ණයෙන්ම විෂය නිර්දේශ වෙනස්. දෘෂ්ටිය වෙනස්. බලන විදිහ වෙනස්. ඒක කිසිසේත්ම Arts උගන්වන්න නෙවේවි යන්නේ. ඊළඟට අපි ඉගෙන ගන්න මම පරණ උගන්වපු කලාව හැටියට බැලුවහොත් එහෙම චිත්‍ර කලාවේ දි මම නම් මේ සෞන්දර්යය කියන වචෙනටත් කැමති නෑ. මම කරන කලාවනම් කිසිම සෞන්දර්යක් නැහැ. ප්‍රති සෞන්දර්යක් එක්ක තමයි මගේ කලාව තියෙන්නේ. Anti Easthetic' සෞන්දර්යක් එතකොට ඒ වගේ ඒවට Anti Easthetic අපි හදන්න ඕනෙ ප්‍රති සෞන්දර්ය අධ්‍යාපන ආයතන, ප්‍රති සෞන්දර්ය අධ්‍යාපන විශ්වවිද්‍යාල. ඉතිං ඒ කොතැනටද අපි යා යුත්තේ, ඒ නිසා මා කියන්නේ, කිසි විවාදයක් නෑ. ශ්‍රීපාලිය එසේ වර්ධනය විය යුතුයි. වෙන භූමි නැත්නං වෙන තැනකින් භූමි හොයා ගන්න. තම ප්‍රශ්න ඒවා විසඳ ගන්න තියෙනවා. ඒකට තමයි අපි ඉන්නේ. අපි වෘත්තිකයො හැටියට එතෙන්ට බැඳිලා ඉන්නකොට අපි ඒකේ විෂය නිර්දේශය සංවර්ධනය කරන්න ඕන. මගෙ දැනුම ශ්‍රීපාලිය ඉල්ලුවොත් මමත් ගිහිං මගේ දැනුම දෙනවා. ඒක තමයි අපේ විශ්වවිද්‍යාල සම්ප්‍රදාය. ආචාර්යවරුන් මේ දේශවලට භූමි වලට කොටු ගහලා නෑ. ඒ දැනුම ප්‍රචාරය කරන්න කියලා ලකුණුත් දෙනවා නේද? ඉතිං ඒක හින්දා කටුවැල් දාගෙන කරන අධ්‍යාපනය කරන ක්‍රමය අහෝසි විය යුතුයි. ඊට වඩා ස්වාධීන නිදහස් විවිධත්වය තියෙන ක්‍රමයක් තමයි අවශ්‍ය. ඒ නිසා ශ්‍රීපාලිය රැක ගනිමු.

බොහොම ස්තූතියි

**සඳරුවන් තිලකරත්න**
**මාධ්‍ය ප්‍රකාශක**
**ශ්‍රීපාලි මණ්ඩපය සුරැකීමේ ව්‍යාපාරය**

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය සුරැකීමේ ව්‍යාපාරයේ මාධ්‍ය ප්‍රකාශක ලෙස, ශ්‍රීපාලි මණ්ඩපයේ 4 වන වසර නියෝජනය කරමින් කතා කරන්නේ,

අද දවසට නිමිත්ත වෙන්නේ ලංකාවේ විශ්වවිද්‍යාලවල සෞන්දර්ය අධ්‍යාපනය බිඳවැටෙයිද කියන කාරණය. මෙතන විද්වත් අදහස්වලින් කියවුණා ලංකාවේ ප්‍රථම වතාවට තමයි මේ විදිහට විශ්වවිද්‍යාලයක් මැදිහත් වෙලා සෞන්දර්ය අධ්‍යාපනය සහ එහි ගමන් මඟ කොහොමද තීරණය වෙන්න ඕනෙ කියන කාරණය ගැන කතා කරන්නෙ කියලා. ඒ නිසා අපි පෞද්ගලිකව හා විශ්වවිද්‍යාල මණ්ඩපය විදිහට සතුටු වෙනවා ඒ වගේ වැදගත් කතිකාවක් අපිට සංවිධානය කරන්න අවස්ථාව ලැබුණු එක ගැන.

අපි අර්බුදය දෙසට ආවොත් එහෙම, මේ අර්බුදය ඇතුළෙ අපි මුල ඉඳලම ඉන්නවා. මේ මොහොත වෙනකොට, මැයි මාසෙ 2 වෙනිදා පුවත්පතක පළවෙන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ………………….. විසින් ප්‍රකාශ කරන සහ වාර්තා කරන දේවල් අනුව තමයි මේ අර්බුදය ගොඩ නැගෙන්නෙ. එතකොට අපිට අවස්ථාව හම්බවෙනවා මැයි 13 වනදා ආචාර්ය මණ්ඩලයට හා ශිෂ්‍ය නියෝජිතයින්ට, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය කටයුතු පිළිබඳ ලේකම් ……………. ගේ මහත්මයා මුණ ගැහෙන්න. ඊට පස්සෙ 19 වෙනිදා මණ්ඩපාධිපතිතුමා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය උසස් අධ්‍යාපන ඇමතිවරයාව මුණ ගැහෙනවා. ඊට පස්සෙ 20 වෙනිදා සියලු වසරවල ශිෂ්‍යයින් නියෝජනය කරමින් අපිට අවස්ථාවක් හම්බවෙනවා, උසස් අධ්‍යාපන ඇමතිවරයාව හමු වෙලා මේ අර්බුදය ගැන කතා කරන්න.

එතකොට ඒ අර්බුදය කතා කරලා මේ වෙනකොට මාසයකටත් කිට්ටුයි. අපිට කියන්න තියෙන්නෙ මෙන්න මේ දේ තමා හරි සරලව. මේ මොහොතෙදි ලංකාවෙ සෞන්දර්ය තියෙන්නෙ කොතනද කියලවත්, එහෙම නැත්නම් එකෙ ස්වභාවය පිළිබඳවත්, සංකල්පීය හා න්‍යායාත්මක දැනුම පිළිබඳවත්, දේශපාලන භූමිකාව තුළ සිටින කිසිම කෙනෙකුට කිසි වැදගත්කමක් නැහැ. මෙතන හුදෙක් තියෙන්නෙ භූමිය

පිළිබඳ ගැටලුවක්. ඒක අපිට ඉතාමත් වගකීමෙන් යුතුව කියන්න පුළුවන්. මොකද අපි සාකච්ජාවට සහභාගි වෙච්ච හින්දා.

ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගලවන්න ඔවුන් ගේන්නෙ හරි සරල තර්ක ටිකක්. ඒ තමයි ලංකාවෙ සෞන්දර්යට නැකම් කියන්නෙ සෞන්දර්ය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයට කිසිම විෂයය නෑකමක් නැහැ, ඒ හින්ද ඔතන ඕක තියෙන්න ඕනෙ නැහැ, ලංකාවෙ සෞන්දර්ය විෂය වර්ධනය වෙනව නම් එක තැනක් යටතේ වර්ධනය වෙන්න ඕන, ඒක ඔය තැන් තැන්වල මණ්ඩප විදිහට තියෙන්න බැහැම වගේ කාරණා.

ඊට පස්සෙ, "කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපයට සලකන්නෙ නැහැ. සම්පත් ලබා දෙන්නෙ නැහැ. ඒ හින්දා මොකටද කොළඹ විශ්වවිද්‍යාලය යටතේ දැන් තව ඉන්නේ? මිලියන 300 ක් හම්බවෙලා තියෙනවා ආධාර විදිහට. ඒවා පරණ විශ්වවිද්‍යාලවලට යොදන්න බැහැ. දියුණු කරන්න පුළුවන් කම තියෙන්නෙ නව විශ්වවිද්‍යාලවලට. ඒ සල්ලි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අපි ලබා දෙනවා. ඒ හින්දා ඕ ගොල්ලො දෙපාර්තුමේන්තු දෙකක් විදිහට සෞන්දර්ය විශ්වවිද්‍යාලය යටතට එන්නම වගේ කතා.

ඒ කතා කරන මොහොත වෙනකොටත් ඉහළ මට්ටමෙහි කිසිවෙකු දන්නෙ නැහැ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අපිව කොහොමද තෝරගන්නෙ කියල. ශ්‍රීපාලියට Z අගය මෙච්චරක් තියෙන්න ඕන, ඉංග්‍රීසි භාෂාවට C තියෙන්න ඕන, ඊට පස්සෙ වෙනම විෂය සමගාමී ප්‍රායෝගික පරීක්ෂණයකට මුහුණ දීලා තමයි ගන්නෙ කියලා කිසිම දෙයක් දන්නෙ නැහැ. ඔවුන් කියන්නෙ "භෞතිකව ශ්‍රීපාලි මණ්ඩපය දියුණු වෙලා නැහැ වගේ ප්‍රශ්න. ඒ ගොල්ලො හිතන්නෙ මෙහෙ දියුණුවක් තියෙන්න ඕන භෞතික පැත්තෙන් විතරයි කියලා. ඒක හින්ද අපි මෙතන කොච්චර න්‍යායගතව, සංකල්පගතව මේක කතා කළත් එතන ඉන්න ඒ පුද්ගලයන්ට ඒවා වැඩක් නැහැ. මේ සටනට අපි වීදිය තෝරගෙන නැහැ. අපි කරන්නෙ අපි යන ගමනේදී, මතවාද එක් රැස් කිරීම ඔස්සේ ජනමතයක් ගොඩ නගන එකයි. මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා කියලා කියන්න මේක අපිට හොඳ වේදිකාවක්.

ඊට පස්සෙ අපි සාකච්ජාව තව දුරටත් අරගෙන යනවා. පැය දෙකක් විතර සාකච්ජාව තියෙනවා. අපි මුලින්ම ස්තුතිවන්ත වෙනවා අපිට එහෙම සාකච්ජාවකට

අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන්. අපිට තව සාකච්ඡාවකට ආරාධනා කරල තියෙනවා. ඊට පස්සෙ අපේ ශ්‍රීපාලි මණ්ඩපය සුරැකීමේ ව්‍යාපාරය නිර්මාණය කර ගැනිම දැකලා ඔවුන් අහන්නෙ ඇයි මොකටද මෙහෙම? මෙච්චර හදිස්සි වෙන්නෙ ඇයි? එහෙම තාම දෙයක් නෑ. සාකච්ඡා මට්ටමේ තියෙන්නෙ. මෙහෙම සංවිධාන හදා ගන්න එපා. මොකටද සංවිධාන හදාගන්නෙම කියලා.

එතකොට මේ මොහොතේදි, මේ ප්‍රශ්නෙදි, උපකුලපති තුමිය අපිට ආශිර්වාදයක් වෙලා ඉන්නවා. ඈ කැමති නෑ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශ්‍රීපාලි මණ්ඩපය ගළවන්න.

මණ්ඩපාධිපතිතුමා මේ සටනෙදි අපිත් එක්ක ඉන්නවා. ඊට පස්සෙ අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඉන්නවා. ඊට පස්සෙ ආදි විද්‍යාර්ථයො ඉන්නවා. අම්මලා තාත්තලා ඉන්නවා. ඊට පස්සෙ සමාජ විද්වතුන් සහ මතවාද දරන සිවිල් සංවිධාන ඉන්නවා. ඒ නිසා මේ මොහොතේදි ශ්‍රීපාලි මණ්ඩපය සුරැකීමේ ව්‍යාපාරය නිවැරදි මාර්ගයක් තෝරාගෙන තියෙනවා. අපි තාම විශ්වාස කරනවා සාකච්ඡා මට්ටමෙන් මේ ප්‍රශ්නය විසඳගන්න පුළුවන් කියලා. අපි මේ මොහොතේදි කියන්න ඕන අපේ මණ්ඩපය විදිහට, අපි ඉල්ලා සිටින්නෙ කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය විදිහට මේ යන ගමන ඉදිරියට යන්න දෙන්න. ස්වාධීන විශ්වවිද්‍යාලයක් දක්වා යන ගමන තිරණය වෙයි තව අවුරුදු 5 ක් හෝ 10 ක් යනවිට. එස්. බී. දිසානායක ඇමතිතුමත් පිළිගන්නවා මේක ස්වාධීන විශ්වවිද්‍යලයක් දක්වා වර්ධනය කරන්න පුළුවන් කියලා.

හැබැයි වෙලා තියෙන්නෙ එතන එහෙම වර්ධනය කරන්න පුළුවන් කියල කිව්වට මෙතන යටින් යන්නෙ වෙනම දෙයක්. ඒක ඕපදූපයක් වෙන්න පුළුවන්. නමුත් ශිෂ්‍යයින් අතරට ඇවිත් තියෙන කතන්දරේ මේකයි. අපි කියන්නෙ පැහැදිලි, හරි සරල කාරණයක් සහ අපිට ආරංචි වෙලා තියෙන දෙයක්.

එකක් තමයි දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ පරිපාලනයෙන් අපිව ගළවනවා. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ පරිපාලනයට අපිව බාර දෙනවා. අපිට පීඨ දෙකක් විදිහට ජනමාධ්‍ය හා ප්‍රසාංගික කලාවේදී උපාධිය ලබා දෙන්නෙ පීඨ දෙකක් කරලා. අපි එක සෞන්දර්ය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරනවා. ඕගොල්ලන්ට කිසි ගැටලුවක් වෙන්නෙ නෑ කියල තමයි මුලින්ම අපිත් එක්ක කතා කරන්නෙ. එතකොට අපිට සෞන්දර්ය ඇතුළට එන්න කියලා ආරාධනා කරනවා. මොනවද

කියන්නෙ? අපිට මේක භෞතික වශයෙන් දියුණු කරන්න පුළුවන්. පරිගණක හම්බවෙනවා. ලැප්ටොප් දෙනවා හැම කෙනාටම. මේක වයි ෆයි කරනවා. ඉන්ටර්නෙට් යන්න පුළුවන් කියලා ලොකු සුරංගනා සිහිනයක් මවනවා. නමුත් විෂයය ගැන, අන්තර්ගතයන් ගැන කිසි කතාවක් නැහැ.

ඉතිං අපි ළඟ තොරතුරු තියෙනවා, කතාකරපු දේවල් තියෙනවා. අපි ඒවට විරුද්ධයි. ඒ හින්ද අපි ප්‍රසිද්ධියේ සහ මේ මණ්ඩපය සංවිධානය කරපු මේ මොහොතෙදි කියන්නෙ, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශ්‍රීපාලි මණ්ඩපය ගළවනවාට අපි විරුද්ධයි. ඒ වගේ ...................... විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරනවාට විරුද්ධයි. අපි විරුද්ධ වෙන්නෙ සහේතුක කාරණා ඇතුව. නමුත් මේ මොහොතෙදි මෙතන ......................... විශ්වවිද්‍යාලය නියෝජනය කරන ආචාර්ය මණ්ඩලය සහෝදර සහෝදරියො ඉන්නවනම් අමනාප වෙන්න එපා. සංකල්පීයව හා න්‍යායාත්මකව ප්‍රායෝගිකව තිබෙන සැබෑ ප්‍රශ්න නිසයි අපි විරුද්ධ වෙන්නෙ. නැතුව ඔබලා සමග තියෙන පෞද්ගලික ප්‍රශ්නයක් නිසාවත්, දේශපාලන ප්‍රශ්න නිසාවත්, වෙන වෙන ප්‍රශ්න නිසාවත් නෙමෙයි. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණඩපය මේ මොහොත වන විට ස්වාධීනව ගොඩ නැගීගෙන එනවා. සියලු ශක්‍යතා වාර්තා වලින් අපිට පෙන්නන්න පුළුවන් අපේ දියුණුව. ඒ වගේම කිසිම දේශපාලන මැදිහත් වීමක් නැහැ. අපි ස්වාධීනව ගොඩනැගෙනවා. ඒ නිසා අපිට ඇඟිල්ල දික්කරන්න තියෙන වාතාවරණය බෙහොම අඩුයි. ඉතිං අපි කියන්නෙ අපේ මණ්ඩපය විදිහට අපි යන ගමනට අපිට දායකත්වය දෙන්න. ...................... ඇමතිතුමා එක වෙලාවකදි තර්කයක් ගේනවා කොළඹ විශ්වවිද්‍යාලය ඕගොල්ලන්ට සලකන්නෙ නැහැ. කොළඹ සලකන්නෙ නැති නිසා අපි ඔය ගොල්ලන්ව සෞන්දර්යට ගේනවා කියලා. අපේ සහෝදරයෙක් ඒ වෙලාවෙ ඉදිරිපත් වෙලා කියනවා - ඒ වෙලාවෙ හිටියා වසර 4ම නියෝජනය කරන අපේ සහෝදරවරු - එහෙමනම් වගකීමක් තියෙන ඇමතිතුමෙක් විදිහට ඔබතුමාට පුළුවන් මේකට මැදිහත් වෙලා පරිපාලන අර්බුදයක් තියෙනවානම් විසඳන්න. එතනදි කියන්නෙ මේක සෞන්දර්යට පැවරුණොත් තමයි මේක දියුණු කරන්න පුළුවන් වෙන්නෙ කියලා. මං දන්නෑ ඇයි එහෙම අධිනිශ්චය වෙච්ච විශ්වාසත් එක්ක කොහොමද ඉන්නෙ කියලා.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව, සෞන්දර්යයේ සිටින ඒ කාලයේ හිටපු අය මේක දාල යන්නෙ චිත්‍රපටි සංස්ථාවට දුරයි, අනෙක් පහසුකම් වලට දුරයි, යන්න එන්න බැහැ, ඊට පස්සෙ  රූපවාහිනී සංස්ථාවට දුරයි, ගුවන්විදුලි සංස්ථාවට දුරයි, ලේඛනාරක්ෂාගාරයට දුරයි, ඊට පස්සෙ නාට්‍යයක් බලන්න යන්න විදිහක් නැහැ කියන කරුණුත් එක්ක. ඉතිං ඇයි ආපහු නැවත එන්න හදන්නෙ? අපිට තියෙන මේ ආරංචි අනුව අපි තවම මේක සොයමින් යනවා - කොළඹ වාණිජ කේන්ද්‍රීය නගරයක් කරන්න යනවා. ඒකට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මොකද ලංකාව තව දියුණු වෙන්න ඕන. ඒ වගේම එතනදී ඔය ඉඩම් ටික නිදහස් කර ගන්න තියෙනවා. ඇල්බට් චන්ද්‍රවංකය, ඊට පස්සෙ තියෙන මහ ගෙදර, Art and Design ඒ ටික. ඒ ඔක්කොම  අරගෙන ඇවිල්ල ශ්‍රීපාලි මණ්ඩපය තියෙන භූමියට, එතන අක්කර 39 ක් තියෙනවා, අක්කර 100 ක් දක්වා වර්ධනය කරලා එතනට සෞන්දර්ය විශ්වවිද්‍යාලයත් ගෙනත් දාලා, ශ්‍රීපාලි මණ්ඩපයේ තියෙන පාඨමාලා 2ත් දෙපාර්තුමේන්තුවක් බවට පත් කරලා ගෙන යෑමේ එක හීනයක් තමයි තියෙන්නේ.

ඔය විදිහට නෙවෙයි, ශ්‍රීපාලි මණ්ඩපය ස්වාධීන මාධ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලයක්  දක්වා දියුණු කරන්න ඕනෙ කියන කාරණය අපි විශ්වාස කරනවා. අපිත් එක්ක ආදරණීය අම්මලා, තාත්තලා, අයියලා, අක්කලා විද්වතුන් ඒ වගේම මාධ්‍ය ඒ සියලුම දෙනා ඉඳියි කියලා අපි හිතනවා මේ සටනෙදි.

ඉතිං අපිට කියන්න තියෙන්නෙ අවසාන වශයෙන්, අද සහභාගි වුණාට ගොඩක් ස්තූතියි. ඒ වගේම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා අපේ තේනුවර සර්ට, මෙතනට ඇවිල්ලා අපිත් එක්ක කතා කරන්න ඒ සංවාදෙට එකතු වෙච්ච එක ගැන. කිසිම පුද්ගලයෙක් අපහසුතාවට පත් කරන්න අපිට උවමනාවක් නැහැ. අපිට තියෙන්නෙ ස්වාධීනව ඉදිරියට යන මේ ගමන ඉතාම විද්වත් මට්ටමෙන්, සාකච්ජා මට්ටමෙන් කරගෙන යන්න. අපේ ජයග්‍රහණය තහවුරු කරන්න. අපි මේක සංවාදයක් විදිහට දිගටම අරගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

ඒ නිසා අපි අවසාන වශයෙන් කියන්නෙ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තීරණයක් අරගෙන තියෙනවා නම් හෝ අරගනිමින් සිටිනවානම් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශ්‍රීපාලි මණ්ඩපය ගළවන්න, අපි විරුද්ධයි. ඒ වගේම හදිස්සියෙවත් එහෙම දෙයක් වුණොත්, අපි නියෝජනය කරන සිව්වැනි වසරෙ අයට, අවුරුදු 3 1/2 ක් කොළඹ

විශ්වවිද්‍යාලය යටතේ ඉගෙනුම ලබා හම්බ වෙන්නෙ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය හා ප්‍රසංගකලාවේදී විශේෂ උපාධිය. 1,2,3 වසර ලියාපදිංචි වෙලා ඉවරයි. ඒ වගේම තව බැජ් එකක් එන්න ලියාපදිංචි වෙලා ඉවරයි. එතකොට අපේ මානව හිමිකම් පිළිබඳ ගැටලුවක් එනවා. මොකද අපි මේ වෙනකොට කැප කරපු ඉතිහාසයක් තියෙන නිසා. කාලයක් තියෙන නිසා. ඒ වෙනුවෙන් පෙනී සිටින්න, මේ ප්‍රශ්නය නිවැරදි ඉරියව්වකින් සමාජගත කරන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා හැමෝටම අපි ආරාධනා කරනවා.

ශ්‍රීපාලි මණ්ඩපය රැක ගැනීමේ ව්‍යාපාරය වෙනුවෙන් අපි පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් අපි අපේ මණ්ඩපයේ අනාගතය වෙනුවෙන් කැපවී සිටිනවා.

ඔබට බොහොම ස්තුතියි.

ශ්‍රීපාලි මණ්ඩපයට ජය වේවා!